# බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ
2565ක් වූ වෙසක් මස 26 වැනි බදාදා



බෞද්ධාලෝකය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
දුරකථනය : 0112691695 / 011 2688517 / 011 2667017
ෆැක්ස් : 011 2688517
web : www.acbc.lk
E-mail : acbc380@gmail.com

## බෞද්ධාලෝක වෙසක් 2565 සැමරීම වෙනුවෙන් බෞද්ධාලෝකය ඊ පුවත්පතක් ලෙස පළ වේ

1958 බෞද්ධාලෝකය පුවත්පත රාජ්‍ය අනුග්‍රහයෙන් පළවීම ආරම්භ විය. පසුකාලීනව රාජ්‍ය අනුග්‍රහය නොලැබීමෙන් මුල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීමේ අපහසුතා නිසා 1967 දී බෞද්ධාලෝකය සඟරාව පළකිරීමට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය කටයුතු කරනු ලැබීය. කාලයක් අඩපණව පැවති බෞද්ධාලෝකය සඟරාව 2003 වර්ෂයේදී බොදු මහා සමුළුවේ සභාපතිනිය වශයෙන් කටයුතු කළ ආචාර්ය මිලිනා සුමතිපාල මැතිණියගේ අනුග්‍රහයෙන් මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දරයන්ගේ මූලිකත්වයෙන් සෑම පොහෝ දිනකම පළ කරනු ලැබූ අතර, එය නැවතත් 2019 වර්ෂයේ දී දිනමිණ පුවත්පතේ පොහෝ දින අතිරේකයක් වශයෙන් පළවිය. බෞද්ධාලෝකය පුවත්පත මුද්‍රණය කරවීම බොදු මහ සමුළුවේ සියවස් සැමරුම තුළ ගන්වමින් සාර්ථකව නැවතත් ආරම්භ කර පුරා මාස හයක් පවත්වාගෙන යාමට හැකිවිය. රටේ පවතින වසංගත තත්ත්වය නිසා මුද්‍රණ කටයුතුවල ගැටලු සැලකිල්ලට ගෙන බෞද්ධාලෝකය පුවත්පත ඊ පුවත්පතක් වශයෙන් පළකිරීම පිළිබඳව බොදු මහා සමුළුවේ වර්තමාන සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමාට ගෞරවය හිමිවේ. ඊ අනුව 2565 වන වෛශාක්‍ය මංගල්‍යය වෙනුවෙන් මෙම ඊ කලාපය නිකුත් කිරීමට ලැබීම ද සුවිශේෂී වේ.

2002 වර්ෂයේ දී ආරම්භ කරන්නට යෙදුණු බෞද්ධාලෝක වෙසක් කලාපය, ශ්‍රී ලංකාවේ ප්‍රථම වෙසක් කලාපය වන අතර එම වෙසක් උත්සවය ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ට මූලිකත්වයක් දෙමින් සැමරීම අඛණ්ඩව වසර දහ හතක් පුරාවට සිදු කරනු ලැබිණ. 2019 වර්ෂයේ අප්‍රේල් 21 ත්‍රස්තවාදී ප්‍රහාරය හා 2020 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වෙසක් සැමරීම සීමා වූ අතර මෙම වර්ෂයේද කොරෝනා වසංගතය හමුවේ ප්‍රතිපත්ති පූජාවන්ට මූලිකත්වය දෙමින් තෙමඟුල සැමරීමට ලෝවැසි බෞද්ධ ජනතාවට සිදුවී ඇත. නිවසට වී තෙමඟුල සමරනු ලබන සියලු ජනතාවට ඊ පුවත්පතක් වශයෙන් අන්තර්ජාලය ඔස්සේ කියවීමට මෙම ඊ කලාපය නිකුත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව බොදු මහා සමුළුවේ ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය වෙත බෞද්ධාලෝකය පුවත්පතේ සංස්කාරක මණ්ඩලයේ කෘතඥතාවය පළකර සිටිමු. ලෝ වැසි සියලු දෙනාටම තුනුරුවන් සතු අසීමිත බලයෙන් යහපතක්ම වේවා!.

බෞද්ධාලෝකය

# සුබෝ බුද්ධානං උප්පාදෝ

**තිරිකුණාමලේ ආනන්ද මහනාහිමි**



2565 බුද්ධ ජයන්තිය හෙවත් වෙසක් පූජෝත්සව මංගල්‍යය එළැඹෙන්නේ ය. කොවිඩ් - 19 බියකරු රෝග උවදුරු අඳුර මැදින් වෙසක් සඳ උදා වන්නේ ය. ජරා-ව්‍යාධි-මරණ යන තුන් බියෙන් වෙසෙසින් ම ව්‍යාධි-මරණ භීතියෙන් පීඩිත වූ බාධිත වූ තර්ජිත වූ ලක්වැසි - ලෝවැසි සකල ජනතාවෝ ම බුදුපියාණන් වහන්සේ ගේ මහා කරුණාවේ සඳ රැස් දහරින් නැහැවෙත් වා !

"තමාට පිහිට තෙමේ ම යැ" යි වදාළ, ලොවේ අවිඳු ගනඳුර දුරලන, හැම දුක් බිය වේදනා දුරින් ම දුරු කරන සදහම් අමා ඔසුව කිසිදු බෙදීමක් නො කොට තුන් ලෝ වැසි හැම සත්නට ම මහා කාරුණාවෙන් වදාළ බුදු පියාණන් වහන්සේ ගේ උතුම් තෙ මඟුල සිහිපත් කරන වෙසක් සඳ රැස් දහර අප හැම ගේ සිත් සතන් සැදැහැයෙන් ඔකඳ කරන්නේ ය. දුකින් පෙළෙන දැවෙන තැවෙන වැළැපෙන සිත් බුද්ධාලම්බන ප්‍රීතියෙන් ඔද වැඩී සැනැහෙන්නේ ය.

"දුක ම ලබාගෙන දුක ම හඹාගෙන දුක ම පොදි බැඳගෙන යළි යළිත් බියකරු සසරට ම ඇදෙනා මිනිසුනි, ගනඳුරු අහසෙහි සැණින් මතු වී දිලී නිවී යන විදුලිය එළියක් බඳු ව ඔබ ලබාගත් මේ මිනිස් දිවියෙහි දී ම විමුක්තියේ පල නෙළාගන්නට වහ වහා උත්සුක නොවන්නේ කිම? අප්‍රමාදී වන්න. සදහමින් සවන් පත් පුබුදුවා පන්සිලින් සුපහන් ව දුලබ මිනිස් දිවිය ඔබට ම පහනක් කැරගන්න. එවිට සම්‍යක් දෘෂ්ටියේ ස්වර්ණාලෝකය ඔබට නිරුපද්‍රිත වූ අභය මාර්ග යක් ක්ෂේම මාවතක් ඔබට දැකිය හැක්කේ ය. නිත්‍ය යැයි සුභ යැයි සුඛ යැයි ඔබ දුටු මායාවේ පටලය සිඳී නැසී යන්නේ ඒ ආලෝකයෙනි. ඔබ ඔබට හිතවත් ව ඔබ ඔබට කුලුණුමත් ව කල්‍යාණ මිත්‍රත්වයේ ද රැකවල් ලබාගෙන නොපමා ව සතිමත් ව ඉදිරියට ම යන්න. නො නැවතී ඒ සඳහා වීර්යය ම කරන්න. ගැටෙන ලෝකය තුළ නො ගැටී ඇලෙන බැඳෙන ලෝකය තුළ නො ඇලී නො බැඳී ඔබට සුවපත් මනසින්, උපේක්ෂාවෙන් ඔබ අපේක්ෂා කරන පරම ශාන්තිය නිසගයෙන් ම අත්පත් කැර ගත හැකි වන්නේ ය. ජයග්‍රහණය වීර්යවන්තයාට ය. ඔබ ඔබට දහම් රැකවරණ ලබා දෙන විට ලෝකයාට ද රැකවරණය ලැබෙන්නේ ය. ලෝකයට පහසුව ලැබෙන්නේත් නිදහස ලැබෙන්නේත් සොම්නස් මල් පුබුදින්නේත් ගහ කොළ පරිසරය පවා නව පණක් ලද්දාක් සේ නව ජීවයෙන් පිබිදෙන්නේත් ඔප දහම් පහන දල්වා ගත් විට ය. සතර බ්‍රහ්ම විහරණ, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීමට තවත් ඉතින් පමා නොවන්න. "අප්පමාදේන සම්පාදේථ" ප්‍රමාදයෙන් අවිද්‍යාවෙන් පාපමිත්‍ර සේවනයෙන් මේ වටිනා ම අවස්ථාව ගිලිහී ගියහොත් ක්ෂේම භූමියක් දැකීමේ පරමාර්ථය ද ඔබගෙන් ගිලිහී ඔබ භයානක වූ සංසාර ඕඝයට හසු වී අනේක විධ වූ ව්‍යසන විපත්වලින් ම දුක්ඛිත වී කල්ප කාල ගණනක් දුගතියෙහි ගැලී ඉන්නට සිදු වනවා නියත ය.

**වෙසක් සඳ රැස් දහර අතරින් ඇතින් විනිවිද ඇසෙන ඒ දහම් වදන් සිහිලින් ඔබ හැම ගේ හදවත් ද සිසිල් වේ වා! සොම්නස් වේ වා!**

**සුබෝ බුද්ධානං උප්පාදෝ!**
**බුදු උපත මුළු ලොවට ම සුවයෙක් මැ යි.**
**සොම්නසෙක් මැ යි.**

**සියලු සත්ත්වයෝ නිදුක් ව නිරෝගී ව**
**සොම්නස් වෙත් වා...!**

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ නව නිලධාරී මණ්ඩලය

| | | |
|---|---|---|
| **සභාපති** | - | චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ |
| **නියෝජ්‍ය සභාපති** | - | මද්දුමගේ රොෂාන් සම්පත් |
| **භාණ්ඩාගාරික** | - | ජෙනරාල් දයා රත්නායක මහතා |
| **සමලේකම්වරු** | - | ඉෂාන් බුද්ධික එදිරිසූරිය |
| | | තුෂාර දිලුම් වාහලතන්ත්‍රි |
| **උපලේකම්වරු** | - | රවී පීරිස් |
| | | එඩ්මන් වික්‍රමසිංහ |
| **උපසභාපති** | - | ලක්ෂ්මන් කෝට්ටගේ |
| | | වසන්ත ද සිල්වා |
| | | නිලීකා සේනානායක |
| | | මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ |
| | | රියර් අද්මිරාල් ආනන්ද පීරිස් |
| | | උපුල් රූපසිංහ |
| | | මහාචාර්ය නිමල් ද සිල්වා |
| | | වෛද්‍ය රාණි ප්‍රනාන්දු |
| | | ආචාර්ය කීර්ති තිලකරත්න |
| | | ආචාර්ය සෙනරත් දිසානායක |

බෞද්ධාලෝකය

**සංස්කාරක මණ්ඩලය**
මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර
වෛද්‍ය රාණි ප්‍රනාන්දු
ඉෂාන් බුද්ධික එදිරිසූරිය
ආචාර්ය අශෝක කරුණාරත්න
නාලක ජයසේන

**කවර සිතුවම**
සරත් නන්ද කමාර

# සෝවාන් මග හෙළිකරන චින්තාමය ප්‍රඥාව

අග්ගමහා ග්‍රන්ථ වාචක පණ්ඩිත, මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ත්‍රිවිධ වූ ප්‍රඥාවන් අතුරෙන් දෙවැන්න චින්තාමය ප්‍රඥාව යි. යමක් ඇසීමෙන් ලබා ගත හැකි ඥානය සුතමය නමින් හැඳින්වෙන අතර යමෙකුගෙන් යමක් නො අසා තමා විසින්ම ඇති කරගන්නා ඥානය චින්තාමය ප්‍රඥා නමින් ගැනෙන බව විසුද්ධිමග්ගයේ සඳහන්වේ (පරතො අසුත්වා පටිලද්ධ පඤ්ඤා) වෙනත් අයෙකුගෙන් උපදෙස් නො ලබා තමා ම සිතීමෙන් මෙම ප්‍රඥාව ලබාගත හැකිය.

නෙත්තිප්පකරණයේ දක්නට ලැබෙන පරිදි චින්තාමය ප්‍රඥාව ලබා ගත යුත්තේ සුතමය ප්‍රඥාව හරහා ය. යම් පුද්ගලයෙක් බුදුරජාණන් වහන්සේ පිළිබඳව හෝ බුද්ධශ්‍රාවකයෙකු පිළිබඳව ශ්‍රද්ධාව ඇතිකරගෙන උන්වහන්සේ වෙතට පැමිණ ධර්මය අසා අසනලද දෙය පිළිබඳව විමර්ශන, තුලන, පරීක්ෂණ හා මානසික අන්වේක්ෂණ කරයි නම් ඒ අවස්ථාවේ දී ඔහු තුළ චින්තාමය ප්‍රඥාව පහළවෙයි. මෝහවිච්ඡේදනිය පැහැදිලි කරන ආකාරයට චින්තාමය ප්‍රඥාව ආකාර තුනකින් හඳුනාගත හැකිය.

1. වෙනත් අයෙකුගෙන් යමක් නො අසා ස්වභාවයෙන්ම ස්වකීය බුද්ධියෙන්ම ජීවනෝපාය කර්මාන්ත ශිල්පවිද්‍යාවන් පිළිබඳව ඇතිකරගන්නා නුවණ.
2. කම්මස්සකතා ඤාණය.
3. සච්චානුලෝමික ඤාණය.

මෙයින් පමුවැන්න සාමාන්‍ය චින්තන ක්‍රියාවලිය හරහා ඇතිවන්නකි. රනින් රිදියෙන් ලෝහයෙන් මැටියෙන් හෝ දැවයෙන් කරනු ලබන කර්මාන්තවල දී වෙනත් අයෙකුගේ උපදේශයකින් තොරව නව නිපැයුමක් කිරීමේ නව්‍ය සිතිවිලි තමාට පහළ කරගත හැකිනම් ඒ චින්තාමය ප්‍රඥාවේ ප්‍රාථමික අවස්ථාවකි. එමෙන්ම තමා විසින් හදාරනු ලබන ශිල්පවිද්‍යාවන්හි දී පරෝපදේශ රහිතව යම් ඥානයක් ඇති කරගත හැකි නම් එය ද එහි ම ඇතුළත්වේ.

දෙවැනි වූ කම්මස්සකතා ඤාණය යනු ආශ්‍රව සහිත වූ පින් පැත්තට නැඹුරු වූ ප්‍රති විපාක දනවන සුලු වූ සම්මාදිට්ඨියයි. මජ්ඣිම නිකායේ මහාචත්තාරීසක සූත්‍රයේ දක්වෙන සම්මාදිට්ඨියේ පළමු අංශය එයින් අදහස්වේ. කම්මස්සකතා සම්මාදිට්ඨිය යන නාමය ද ඒ සඳහා යොදාගනු ලැබේ. එයින් අදහස් කරන්නේ දසවැදෑරුම් මිථ්‍යා දෘෂ්ටියෙන් තොරවීමයි. එනම් 'දුන් දෙයෙහි විපාක ඇත. යාගයෙහි විපාක ඇත. හෝමයේ විපාක ඇත. යහපත් හා අයහපත් සේ කළ කර්මවල ප්‍රති විපාක ඇත. මෙලොව ඇත. පරලොව ඇත. මව ඇත. පියා ඇත. ඕපපාතික සත්වයෝ ඇත. මෙලොවත් පරලොවත් තමාම දැන ප්‍රත්‍යක්ෂ කර සිටින නිවැරදි මගට පිළිපන් මහණ බමුණන් ඇත' යන පිළිගැනීමයි. මෙය සම්මාදිට්ඨියේ එක් අවස්ථාවක් පමණි. එපමණකින් එය සම්පූර්ණ වන්නේ නැත. එය සම්පූර්ණ වන්නේ සච්චානුලෝමික ඤාණය ඇති විටය.

දීඝනිකාය ටීකාවේ විස්තරකර ඇති පරිදි සච්චානුලෝමික ඤාණය යනු සත්‍යාවබෝධය පිණිස නිසි පරිදි පවත්වාගත යුතු ඥානයයි (සච්ච පටිවේධස්ස අනුලෝමනතො සච්චානුලොමිකන්ති වුච්චති) ඉහතින් සඳහන් කළ මිථ්‍යා අදහස්වලින් තොරව ක්‍රියාකරන කල්හි පුද්ගලයා ශාස්වත හා උච්ඡේද යන දෘෂ්ටීන්ට නොවැටී හේතුඵල දර්ශනයෙන් සංස්කාරයන්ගේ පටිච්චසමුත්පන්න භාවය වටහාගන්නට සමත්කම් ඇතිකරගනියි. ඒ තුළින් ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගාංගයක් වූ සම්මාදිට්ඨිය ඇති කරගනියි. එය සම්මාදිට්ඨියේ දෙවැනි අවස්ථාවයි. විශේෂයෙන්ම මෙම ආර්ය සම්මාදිට්ඨි ප්‍රතිලාභය පිණිස පරතෝඝෝෂය හා යෝනිසෝ මනසිකාරය ප්‍රත්‍යවන බව අංගුත්තර නිකායේ සම්මාදිට්ඨිපච්චය සූත්‍රයේ සඳහන් වේ. ඉහතින් සඳහන් කළ සච්චානුලෝමික ඤාණය ඇති කරගත හැක්කේ එම යෝනිසෝමනසිකාරය තුළිනි එම ඥානය චින්තාමය ප්‍රඥාවේ උසස්ම අවස්ථාවයි. එය ඇති වන්නේ ධර්මය ඇසූ පසු අසනලද දෙය පිළිබඳ විමර්ශන, තුලන, පරීක්ෂණ හා මානසික අන්වේෂණ කිරීමෙනි. මේ විමර්ශන, තුලන, පරීක්ෂණාදිය හා යෝනිසෝමනසිකාරය යනු එකක්මය. නෙත්තිප්පකරණයේ හා පේටකෝපදේසයේ සඳහන් පරිදි චින්තාමය ප්‍රඥාව ඇතිවන්නේ තමා තුළ පහළ වූ යෝනිසෝමනසිකාරය හේතුකරගෙනය (පච්චත්තසමුට්ඨිතො යෝනිසෝමනසිකාරා චින්තාමයී පඤ්ඤා).

එනිසා යෝනිසෝමනසිකාර නම් වූ ධර්ම ප්‍රත්‍යවේක්ෂණය චින්තාමය ප්‍රඥාවේ පදනම බව අප වටහාගත යුතුය. එපමණක් නොව ධර්ම ප්‍රත්‍යවේක්ෂණය හා චින්තාමය ප්‍රඥාව අතර අවියෝජනීය වූ සම්බන්ධයක් ඇති බව ද අමතක නොකළ යුතුයි. මජ්ඣිම නිකායාගත චංකී සූත්‍රයෙහි දැක්වෙන සත්‍යානුරක්ෂණයට ඉවහල් වන කරුණු පස අතුරින් ආකාර පරිවිතක්කයෙහි විරුද්ධ අංශය මේ ධර්ම ප්‍රත්‍යවේක්ෂණයයි ආකාරපරිවිතක්ක යනු මතුපිටින් පෙනෙන්නට ඇති ලක්ෂණ ප්‍රත්‍යවේක්ෂා කරමින් සලකා බැලීමයි. යමක් පිළිබඳව ගැඹුරු ලෙසින් හෝ තීක්ෂ්ණ ලෙසින් පරීක්ෂා නොකොට මතුපිටින් බලා නිගමනවලට එළඹීමයි. එය ඥාන මාර්ගයක් නොවෙන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. එහෙත් හේතු යුක්තීන්ට අනුයුක්තව කල්පනා කිරීම තුළින් ප්‍රඥාව පහළ කරගත හැකිවේ. ආගමික ජීවිතයේ දී ශ්‍රාවකයෙකු මූලිකව අනුගමනය කළ යුතු සද්ධාවල රුචිය හා අනුස්සවය අනුග මනය කළ ශ්‍රාවකයා සෙසු සමය සම්ප්‍රදායයන්හි හා සිය ශාස්තෘවරයාගේ ඉගැන්වීම් විමසමින් හේතු යුක්තීන්ට අනුව කල්පනා කළයුතු වෙයි ප්‍රත්‍යවේක්ෂා කළ යුතු වෙයි. එසේ ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යථා තත්වය පසක් කරගැනීමට නිවැරදි මග හෙළි පෙහෙළි වෙයි. යෝනිසෝ මනසිකාරය යනු එම ප්‍රත්‍යවේක්ෂණය යි.

ඒ තුළ සිදුවන වැදගත්ම කාර්ය වීමංසනය හෙවත් විමර්ශනය යි. ත්‍රිපිටකය තුළ යෙදී ඇති වීමංසා ශබ්දයෙන් මෙනෙහි කිරීම, අත්හදාබැලීම, ධර්මචින්තනය යන අර්ථ ප්‍රකටවෙයි. අටුවාවලදී ඒ ඒ ධර්මස්වභාවල විමසීම ඒ පිළිබඳ ප්‍රඥාව උපපරීක්ෂණය, තුලනයකිරීම, සැසඳීම ආදී අර්ථ ප්‍රකට වී තිබේ. සමස්තයක් ලෙස ගත් විට විචාරපූර්වක විමසීම, සැසඳීම, තුලනය කිරීම, පිරික්සීම යන අර්ථ ඇතිව වීමංසා ශබ්දය ව්‍යවහාරය කර ඇතැයි කිව හැකියි යොනිසෝ මනසිකාරයෙන් සිදුවන්නේ එම විමර්ශන ක්‍රියාවලියයි. එය එක් ක්‍රියාවක් නොව ක්‍රියාවලියක් බව මෙහි දී විශේෂයෙන් කිවයුතුය.

එම විමර්ශන ක්‍රියාවලිය එක් පසෙකින් ධම්මවිචය සම්බොජ්ඣංගය බවට ද පත්වේ. යෝනිසෝමනසිකාරය හරහා සම්මාදිට්ඨිය ආර්ය ප්‍රතිපදාවෙහි වර්ධනය වන විට එය වඩාත් දාර්ශනික තත්වයට පත්වේ. සංයුත්ත නිකායේ කච්චායන වච්ඡගොත්ත සූත්‍රය එහි ස්වභාවය පිළිබඳව පැහැදිලි කර තිබේ. එහි සඳහන් පරිදි ලෝකයේ ඇත හා නැත යනුවෙන් අංශ දෙකක් පවතියි. මේ දෙකින් එකකින් මිදීම යනු අනෙක් අන්තය අවධාරණය කරගැනීමයි. සම්‍යග්දෘෂ්ටියේ දී මේ අන්ත දෙකින් එකකට හෝ ගමන් කිරීමට අවකාශයක් නොසැලසේ. මෙහි ඇත යන්නෙන් ගැනෙන්නේ ශාස්වත වාදය යි. නැත යන්නෙන් ගැනෙන්නේ උච්ඡේද වාදය යි. සම්මාදිට්ඨිය නිසා ලෝකසමුදය පිළිබඳව හෙවත් සත්වයාගේ හටගැනීම පිළිබඳ හේතුඵලසම්බන්ධතාව දකින කල්හි නැත යන ව්‍යවහාරයට ඉඩක් නැත. ලෝක නිරෝධය දක්නා කල්හි ඇත යන ව්‍යවහාරයට ඉඩක් නැත. මෙම හටගැනීම හා නැතිවීම දැකීම නිසා උපාදාන කරගන්නේ නැත. එනම් දැඩිව අල්ලා ගැනීමකට පත් නොවේ. මගේ ආත්මයයි යමක් අපේක්ෂා නොකරයි.

උපදින්නේත් නැතිවන්නේත් දුකම බව දැනගනියි. ලෝකය පිහිටා ඇත්තේ දුකමත බව වටහාගනියි (දුක්ඛෙ ලෝකෝ පතිට්ඨිතෝ) එපමණක් නොව ලෝකය හෙවත් සත්වයා පිළිබඳ අනිත්‍යාදි සංකල්පනාවන් ද මෙහිදී ඇතිකරගනියි. එනම් ත්‍රිලක්ෂණයට අනුව ස්වකීය චින්තාවන් වර්ධනය කරගනියි. චින්තාමය ප්‍රඥාව සේ හඳුන්වන්නේ මෙයයි.

විශේෂයෙන්ම චින්තාමය ප්‍රඥාව ඇති වූ කල්හි පුද්ගලයා සසුන් පිළිවෙතෙහි තහවුරු වන බව ද කිව යුතුය. චින්තාමය ප්‍රඥාව ඇති කරගත් කල්හි හෙවත් යෝනිසෝ මනසිකාරය තුළින් සම්මාදිට්ඨිය ඇතිකරගත් කල්හි සසර පැවැත්ම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති කරගන්නට හැකියාව ලැබේ. සත්ත්වයා යනු අන්‍යොන්‍ය වශයෙන් යැපෙන සුලු අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ ආදී හේතු ඵල සම්බන්ධතාවක් ලෙසත් ස්කන්ධ ක්‍රියාකාරීත්වයක් ලෙසත් දැකීම සම්මාදිට්ඨියයි. එම පැහැදිලි අවබෝධය ඇති කල්හි සදාකාලිකව පවතින ආත්මන් බ්‍රහ්මන් වැනි සංකල්ප මායාවන්ට නොවැටෙයි. සත්වයා පිළිබඳ සත්‍ය වූ කාරණය නම් අනිත්‍යතාව හෙවත් වෙනස්වීමයි. ඒ අනිත්‍යතාව නිසා ස්ථිරව සංසාරයෙහි සැප විඳින්නට නොහැකි බව ද වටහාගන්නට හැකිවේ. එහෙයින්ම කිසිවක් සාරවශයෙන් සදාකාලිව පවතින්නේයැයි පිළිගැනීමට නොහැකි බව ද වටහා ගත හැකිවේ. මෙම අවබෝධය ඇති විට කිසිවිටෙකත් දෘෂ්ටි කාන්තාරයන්හි අතරමං වන්නේ නැත.

මෙම සම්‍යග්දෘෂ්ටිය සැකසුණු තැනැත්තා සසර බැඳ තබන දස සංයෝජනවලින් පළමු තුන ප්‍රහීණ කළ අයෙක්වෙයි. අනිත්‍ය දර්ශනයෙන් යුක්ත නිසා ස්කන්ධයන්ගෙන් කිසිවක් සාර වශයෙන් නොගන්නා විට සක්කායදිට්ඨිය නැතිවෙයි. සසර පැවැත්මට මුල්වන හේතු සාධක වැටහෙන විට නිර්වාණ අවබෝධය සඳහා කළ යුතු කාර්යය වැටහේ. එලෙස කුශලය පැහැදිලි වන විට සැක උපදින්නේ නැත. ඒ විචිකිච්ඡා ප්‍රහාණයයි. දෘෂ්ටිය පැහැදිලි නම් ඒ පිළිබඳ සැකයක් ද නොමැත්තේ නම් නිවැරදි පිළිවෙත් විනා අන්‍ය ව්‍රත පූරණාදියක් සිදුවන්නේ නැත. ඒ සීලබ්බතපරාමාසය නැති වීමයි. සම්මාදිට්ඨිය පරිපූර්ණත්වයට පත්කරන යෝනිසෝමනසිකාරය නිසා සංයෝජන නැතිවන ආකාරය මෙයින් පැහැදිලිවේ. මේ පිළිබඳ පැහැදිලි විවරණයක් සබ්බාසව සූත්‍රයෙන් ඉදිරිපත් වී තිබේ. සක්කායදිට්ඨි විචිකිච්ඡා හා සීලබ්බතපරාමාස යන සංයෝජනත්‍රය ප්‍රහාණය කළ පුද්ගලයා සෝවාන් මාර්ග ඵල අවබෝධ කළ ආර්යයෙක් බවට පත්වෙයි.

මෙයින් පැහැදිලි වන්නේ යෝනිසෝ මනසිකාරය නම් වූ චින්තාමය ප්‍රඥාව නිසා සෝවාන් ආර්යශ්‍රාවකයන් බිහිවන බවය.

# Be the Agent of Change

A Wesak Message by Venerable Siri Vajirārāmaye Ñānasīha

A person being chased by a trumpeting wild elephant was running pell-mell to save his precious life and accidently fell into a pit. He managed to hold on to a creeper which was getting loosened by his weight. Looking down he saw venomous vipers gawping at him and was shivering with fright. Because of the sudden jerk of the creeper a honey comb was loosened and sweet honey was dripping down his arm. Forgetting all dangers he started lapping up the honey in total bliss.



The human race with all its institutional build ups to protect vested interests and political gimmickry is similar to that person. Due to human action and mismanagement of resources the current pandemic is bringing death in an untold manner. Economies are failing with dire consequences yet to come. Wars of different kinds are being fought on failed ideologies. Unconcerned that time is running out, people and governments seem to live in a fool's paradise talking of the need for change and expecting others to change.

Herein, the message of the Buddha is relevant to humankind. Ageing, sickness, death are common to all and at death all the accumulations are left behind. Hence, what is required is a change of heart from aggressiveness and possessiveness to boundless loving-kindness and compassion to all living beings, conscious of the universality of impermanence (anicca) and unsatisfactoriness (dukkha). Decisions and actions, at whatever level, should emanate from such thoughts aiming at the happiness and welfare of all beings, mindful always that mental, verbal or physical actions based on human greed, will bring greater disaster. Key to human happiness is with us depending on the actions taken here and now.



On this thrice blessed day of Wesak, let us determine to change our wasteful ways and work together for the happiness and welfare of everyone. In this regard the oft-quoted words of Gandhiji comes to mind, "Be the change that you wish to see in the world." It so happens that people as well as nations are very critical of the outside world but do not exert to bring about the changes themselves. As Albert Einstein says (quote) "doing the same thing over and over again and expecting different results is insanity."

May I suggest one change that will not only make you healthy, compassionate and loveable but also make the world more liveable. Let us give a fresh lease of life for our innocent and helpless friends. Let us resolve not to eat the flesh of any living creature for at least one month starting from the day of Wesak. Please remember that the greenhouse emissions of the livestock industry is said to be more than the emissions of all vehicles used. Hence, by a simple act of ours we can give life also to a dying planet and contribute towards resolving environment and health problems whilst extending loving-kindness to all.

**May you be well and happy and may you resolve also to be an agent of change.**

# කේශ ධාතු ගැන අප්‍රකට කතාවක්

කථිකාචාර්ය, ආචාර්ය හසන්ත සමරසිංහ

තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ඉතිරි වූ ධාතූන් වහන්සේලා නොයෙක් අයුරින් බෙදී ගිය ආකාරය පිළිබඳ කතාව ප්‍රකට ය. බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයෙහි ම ද උන්වහන්සේගේ ඇතැම් ශාරීරික ධාතූන් වහන්සේලා තැන්පත් කොට චෛත්‍යයන් කරවා වන්දනා මාන කළ බවට සාධක හමු වේ. තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් බුදුන් වහන්සේගේ කේශ ධාතු ගෙන ගොස් චෛත්‍යයන් කරවා වන්දනා කිරීමේ පුවත මීට එක් උදාහරණයකි. තවද තථාගතයන් වහන්සේ ජීවමාන සමයෙහි ම උන්වහන්සේගේ කේශ ධාතූන් කොටස් සයක් වෙනුවෙන් චෛත්‍යයන් කොට වන්දනා කළ පුවතක් ඡකෙසධාතුවංසයෙන් හමු වේ.



මෙහි දැක්වූ ඡකෙසධාතුවංසයත් එහි ඇතුළත් කථා පුවතත් සමාජයෙහි බෙහෙවින් අප්‍රකට ය. එය දන්නෝ ඉතා සුළු පිරිසකි. මෙහිදී ඡකෙසධාතුවංසය පිළිබඳ ව මුලින් ම කරුණු දැක්වේ. ඡකෙසධාතුවංසය යනු මෙතෙක් ශ්‍රී ලංකාව තුළ විධිමත් අයුරින් ශාස්ත්‍රීය සංස්කරණයකට භාජනය නො වූ කෘතියකි. එහෙත් එහි එක් මුද්‍රිත ප්‍රකාශනයක් අපට හමු වේ. එය වේ. වි. අභයගුණවර්ධන පඬිතුමන් විසින් සිංහල පරිවර්තනය සමඟ කළ පාලි පෙළ සංස්කරණයකි. 1993 වර්ෂයේදී මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වූ මෙම අනගි ග්‍රන්ථයේ පාලි පෙළෙහි දෝෂ බොහෝ ය. ප්‍රස්තාවනාවෙහි ද දෝෂස්ථාන බොහෝ ය. එහෙත් අප දන්නා පරිදි සිංහල අකුරින් වූ පළමු ඡකෙසධාතුවංස මුද්‍රණය මෙය බැවින් ද සංස්කාරකතුමන්ගේ උත්සාහය බොහෝ දුරකට සාර්ථක ව ඇති බැවින් ද එතුමන්ට සිංහල බෞද්ධ සැමගේ කෘතඥතාවය හිමි විය යුතු ය.

තවද මීට අමතර ව ඡකෙසධාතුවංසයෙහි පුස්කොළ පිටපත් දෙකක් කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි තිබී අපට හමු වූයෙන් ඒවා ද පිටපත් කොට ගතිමු. තවද මෙම කෘතියෙහි බුරුම අක්ෂර පිටපත් ඇතැයි කරුණු හමු වේ. මීට අමතර ව මෙම වටිනා කුඩා කෘතිය වර්ෂ 1885 දී එංගලන්තයේ පාලි පොත් සමාගමේ සඟරාවෙහි ද පළ වී ඇත. සාමාන්‍ය පාලි සූත්‍රයකට සමාන ස්වරූපයකින් මෙම කෘතිය ඉදිරිපත් වේ. මෙහි අන්තර්ගත කතාව මෙසේ ය. එක් සමයක අප භාග්‍යවතුන් වහන්සේ ලෙහෙණුන් වාසය කළ වේළුවනයෙහි සිව්වනක් පිරිසට දහම් දෙසමින් වැඩ විසූ සේක. ඒ අවස්ථාවෙහි අනුරුද්ධ, සෝභිත, පදුමුත්තර, ගුණසාගර, ඤාණපණ්ඩිත හා රේවත යන රහතන් වහන්සේ සය නම කතිකාවතක් ඇති කොට ගෙන බුදුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට වැද එකත් පසෙකින් වාඩි වී මෙසේ පැවසූහ.

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ විසින් සමතිස් පාරමී දම් පුරන ලද්දේ එක් දේශයක සත්ත්වයන්ගේ හිත සුව පිණිස පමණක් නො වේ. සියලු ම සත්ත්වයන්ගේ හිත සුව පිණිස ම ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ වැඩ වසන තැනට ආසන්නතර සත්ත්වයෝ ඔබ වහන්සේගේ දැක්මෙන් උභයාර්ථ සිද්ධිය ම සලසා ගනිති. ස්වාමීනි, එහෙත් මේ දුර වසන සත්ත්වයන්ගේ හිත සුව පිණිස භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය හා බැඳුණු යම් පූජනීය වස්තුවක් තිබිය යුතු ය. ස්වාමීනි, මහ සමුදුරට නුදුරෙහි එක් ප්‍රත්‍යන්ත දේශයක බොහෝ ජනයා වාසය කරති. ඔවුන්ට අනුකම්පාවෙන් පිදිය යුතු යමක් දීමට වටියි.''

තෙරවරුන්ගේ ඒ වචන අසා මහා කරුණාවෙන් යුතු වූ බුදු රජාණන් වහන්සේ සිය හිස පිරිමැදි සේක. එවිට කේශ ධාතූන් සය නමක් ශ්‍රී හස්තයට පැමිණුනි. බුදුන් වහන්සේ එම කේශ ධාතු සය නම එම රහතන් වහන්සේලාට දුන් සේක. ඒ රහත් උතුමෝ මහත් ගෞරවයෙන් යුතු ව සිය හිසින් ම කේශ ධාතු පිළිගත්හ. එවිට එහි වැඩ සිටි ආනන්ද තෙරණුවෝ බුදු රදුන්ගෙන් මෙ කරුණ විචාළහ.

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ කේශ ධාතු හේතුවෙන් එම ජනපද වැසියන්ට යම් අනතුරක් සිදු වේ ද?'' යනුවෙනි. භාග්‍යවතුන් වහන්සේ එයට මෙසේ පිළිතුරු දුන්හ.

''ආනන්දය, කේශ ධාතු නිසා එම ජනපද වැසියන්ට වන යහපතක් මිස අනතුරක් නො දකිමි. ආනන්දය, තථාගත පරිනිර්වාණයෙන් පසු වර්ෂ පන්දහසක් කල් මාගේ සසුන පවතින්නේ ය. තවද මෙම කේශ ධාතු සය නම වසර දෙදහස් පන්සියයකට අධික කාලයක් ආරක්ෂිත ව පවතින්නේ ය. ඉන් පසු ව මහා පූජා සත්කාර ලබන්නේ ය. මේ එක් එක් කේශ ධාතුවක් සඳහා එක් එක් චෛත්‍යය බැගින් මහා සත්ත්වයන්ගේ මූලිකත්වයෙන් ඉදි වන්නේ ය'' යනුවෙනි.

මෙසේ ඒ කේශ ධාතු ලබා ගත් රහතන් වහන්සේ සය නම භාග්‍යවතුන් වහන්සේට වැද පැදකුණු කොට අහසට නැඟී පිටත් වූහ. එසේ පිටත් වූ මේ සය දෙනා වහන්සේ මුලින් සඳහන් කළ ඒ ඈත පිටිසර ප්‍රදේශයට වැඩම කොට එහි එක් රාත්‍රියක් වැඩ සිට පසු දින උදය වරුවේ පිඬු සිඟා ගෙන වැළඳූහ. දන් වළඳා දකුණු දිශා භාගයට වැඩම කළ තෙරවරුන්ට රමණීය වන ගත පෙදෙසක් හමු විය. රමණීය වූ ඒ භූමි භාගය දැක සතුටට පත් වූ තෙරවරු මෙ තැන එක් කේශ ධාතුවක් නිදන් කරන්නට සුදුසු යැයි සිතූහ. එහෙත් ඒ සඳහා දායකයෙකු නොමැති ප්‍රශ්නය විය. එකල්හි එහි වැඩ සිටි සය නම අතුරින් අනුරුද්ධ තෙරණුවෝ ඒ පිළිබඳ ව අධිෂ්ඨානයක් කළහ.

අනුරුද්ධ තෙරුන්ගේ එම අධිෂ්ඨානය හේතුවෙන් ශක්‍රයාගේ පණ්ඩුකම්බලසිලාසනය උණු බවක් දැක්වී ය. සිය අසුන උණු වීමට හේතු විමසන ශක්‍රයාට එයට හේතු කරුණු පෙනී ජිනේන්ද්‍රයන් වහන්සේගේ උතුම් කේශ ධාතූනට දායකයෙකු වීමේ භාග්‍යය දැක දෙව්ලොවින් බැස එම රහත් උතුමන් සය නම ඉදිරියේ පහළ විය.

ශ්‍රද්ධාවෙන් ඔද වැඩුණු ශක්‍ර තෙමේ අනුරුද්ධ තෙරුන්ගේ ශ්‍රී හස්තයෙන් එක් කේශ ධාතු නමක් ලැබ සිය සිරසෙහි තබා සතුටින් ඔද වැඩුණු සිතින් යුතු ව චෛත්‍යයක් නිර්මාණය කරන්නට විය. එහි අසූ මහා ශ්‍රාවකයන්ගේ රූප, සර්වඥයන් වහන්සේගේ දෙමව්පියන්ගේ රූප හා අනූපම රූ ඇති ඒ සර්වඥයන් වහන්සේගේ රූපය ද මැවී ය. ඒ සියල්ල මැද සත් රුවන් රාශියක් කොට හාත්පසින් රන් දැලකින් වට කොට සුදු ඡත්‍රයක් ඔසවා එයට යටින් නොයෙක් රත්නයන්ගෙන් බබළන පළඟක් මවා දශබලයන් වහන්සේගේ කේශ ධාතුව සිය සිරසින් ගෙන තවත් නොයෙක් සක්කාර කොට එහි තැන්පත් කළේ ය. එම අවස්ථාවෙහි නොයෙක් ආශ්චර්යයන් සිදු විය. ඉන් පසු චෛත්‍යයෙහි ඉතිරි කටයුතු ද කොට නිමවී ය.

අනතුරු ව අනුරුද්ධ තෙරුන් වහන්සේ එම ධාතුන් වහන්සේ තමන් වහන්සේ විසින් ගෙනෙන ලද බව ප්‍රකාශ කරනු වස් තමන් වහන්සේගේ ප්‍රතිමා රූපයක් ද එහි කරවී ය. සක් දෙව් රජ තෙමේ එක් රන් ගුහාවක් කොට ධාතු පූජාවක් කළේ ය. ආරක්ෂාව පිණිස එක් දිව්‍ය පුත්‍රයෙකු ද එහි තැබී ය. සතුටු වූ ප්‍රීතිමත් සිත් ඇති ඒ රහතන් වහන්සේ සය නම ධාතු සෑයට පසඟ පිහිටුවා වැන්දාහ.

මෙලෙස පළමු සෑයෙහි කටයුතු නිමවා ඒ නුදුරෙහි දකුණු දිශා භාගයෙහි තුන් ගව්වක් පමණ තැන් ගොස් නොයෙක් ආකාරයේ වැලි ගොඩවල්වලින් යුතු, පරම රමණීය ගස්, ගල් ආදියෙන් තොර මැනවින් සකස් කළාක් වැනි භූමියකට වැඩම කළහ. එම ස්ථානය ද කේශ ධාතුවක් තැන්පත් කිරීමට සුදුසු තැනකියි සිතා නැවතුණහ. ඉක්බිති එම පිරිසෙහි වැඩ සිටි සෝභිත තෙරුන් වහන්සේ ''සෑය කිරීම සඳහා දායකයෙකු සෙවීම මට භාර'' යැයි වදාරා ඒ සඳහා අධිෂ්ඨානයක් කළහ. එම උත්තම අධිෂ්ඨානයට අනුව ම වළා ගැබ අතරින් නික්මුණු පජ්ජුන්න නම් දිව්‍ය පුත්‍රයා මහත් පිරිවර සමගින් තෙරුන් ඉදිරියෙහි පහළ විය. එවිට සෝභිත තෙරණුවෝ එම දිව්‍ය පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේගේ ධාතු සෑය ඉදි කිරීමේ දායකයෙකු වන ලෙස වදාළහ. පජ්ජුන්න දෙවියා තෙරුන්ගේ එම ආරාධනාව සතුටු සිතින් පිළිගත්තේ ය.

පජ්ජුන්න දෙවියා ද සිය සෘද්ධියෙන් අසූ මහා සවුවන්ගේ රූප, බුදු රදුන්ගේ හා උන්වහන්සේගේ දෙමව්පියන්ගේ රූප ආදිය කරමින් නොයෙක් අලංකාරවත් දෑ කරමින් සෑයෙහි වැඩ කටයුතු නිම කළේ ය. අවසානයේ චෛත්‍ය ප්‍රාකාරයක් ද බැඳ ඒ සමීපයේ පොකුණක් කිරීම ආදිය ද කළේ ය. අනෙක් දෙවියෝ ද සතුටු සිතින් මේ පින්කම්වලට උපකාරී වූ අතර සියල්ලෝ පින්කම සතුටින් අනුමෝදන් වූහ.

පජ්ජුන්න දිව්‍ය පුත්‍රයාගේ ථූප කරණයෙන් පසු එතැනින් නික්මුණු රහතන් වහන්සේ සය නම තවත් දුරකට වැඩම කළ අතර එක් කේශ ධාතුවක් මෙහි තැන්පත් කිරීම සුදුසු යැයි එහිදී තීරණය විය. අනතුරු ව මෙම කටයුත්ත සඳහා දායකයෙකු සෙවීමේ කටයුත්ත භාර ගත් පදුමුත්තර තෙරණුවෝ පෙර තෙරවරුන් මෙන් ඒ සඳහා අධිෂ්ඨානයක් කළහ. එහිදී එම කටයුත්ත සඳහා මුහුද රක්නා මණිමේඛලා නම් දෙව් දුව පිරිවර සහිත ව පැමිණ ඉදිරිපත් වූවා ය. තමා කාන්තාවක බැවින් චෛත්‍යය කෙසේ කළ යුතු දැයි ඇය විමසුවා ය. එවිට තෙරවරු ''වැටුප් ගෙවීමට හැකි නම් මිනිසුන් එය කරනු ඇත'' යනුවෙන් වදාළහ. මැනවැයි තෙරවරුන්ගේ අවවාදය පිළිගත් ඇය වෙනත් වෙසක් ගෙන මිනිසුන් සොයා ගොස් ඔවුන්ට වැටුප් ගෙවා ධාතු සෑය මැනවින් කරවූවා ය.

මණිමේඛලාවගේ ථූප කරණයෙන් පසු ව තෙරවරු සය නම උතුරු දිශාවට වැඩම කළහ. එසේ වඩින අතරමග ශීත සෙවණැලි ඇති එක් නුග රුකකට අධිගෘහිත දෙවියෙක් තෙරවරුන්ගේ ආගමනය දැක ඉදිරියට ගොස් ''ස්වාමීනි, මෙහි වැඩම කළේ කුමක් නිසා ද ?'' යනුවෙන් විමසුවේ ය. තමන් වහන්සේලා එහි වැඩම කළ හේතුව වදාළ විට රුක් දෙවියා සතුටට පත් ව එය අනුමෝදන් විය.

අනතුරු ව එම භික්ෂු පිරිසෙහි වැඩ සිටි ගුණසාගර තෙරණුවෝ සෑය ඉදි කිරීමට දායකයෙකු සෙවීමේ කටයුත්ත භාර ගෙන ඒ සඳහා අධිෂ්ඨානයක් කළේ ය. එහිදී බුදු සසුන ගැන දන්නා මුහුදු ගිය වෙළෙඳ පිරිසක් සහිත නැවක් සුළං වේගයෙන් තෙරවරුන් වැඩ සිටි දිශාවට පැමිණින ඉන් පසු තෙරවරු දැන හැඳින ගත් එහි වූ නැවියා හා පිරිස එක් වී ධාතු සෑය ඉදි කිරීමට භාර ගත්හ.

එහිදී එක් රුක් දේවතාවෙකු ද ඔවුන්ගේ සහයට ඉදිරිපත් විය. සියල්ලන්ගේ සහභාගිත්වයෙන් ධාතු සෑයේ කටයුතු නිම කැරිණි. අවසානයේදී මේ කටයුතු සඳහා සහය වූ රුක් දෙවියා සෑය ආරක්‍ෂා කරමින් දීර්ඝායුෂ්ක ව සිටින්නට විය.

ඉන් අනතුරු ව තෙරවරු එම ස්ථානයෙන් නැගෙනහිර දිශාවෙහි ගංගා තීරයෙහි එක් රමණීය ස්ථානයක් කරා එළැඹුණහ. එහිදී ඥාණපණ්ඩිත තෙරුන්ගේ අදිටනින් වරුණ නම් නා රජු පිරිවර සහිත ව පැමිණ ඉතිරි වූ තවත් කේශ ධාතුවක් වෙනුවෙන් සෑයක් කළේ ය. වරුණ නා රජුගේ ථූප කරණයෙන් පසු තෙර පිරිස එම ස්ථානයෙන් උතුරු දිශාවට වැඩම කොට ඉතිරි වූ එක ම කේශ ධාතුව වෙනුවෙන් සෑයක් කිරීමට ස්ථානයක් තෝරා ගත්හ. අනතුරු ව රේවත තෙරුන්ගේ අදිටනින් එහි පැමිණි ශ්‍රද්ධාවත් දෙමළ නැවියන් පිරිසක් එම සය වන කේශ ධාතු ථූපය කළහ. මෙම ථූපය ශ්‍රද්ධාවෙන් ම කළ එකක් බැවින් සද්ධාචෙතිය යනුවෙන් ද දෙමළ උපාසකයන් විසින් කළ එකක් බැවින් දමිළචෙතිය නමින් ද හැඳින්විණ.

මේ ආකාරයට තථාගතයන් වහන්සේගෙන් කේශ ධාතු ලැබූ එම රහතන් වහන්සේ සය නමගේ බලාපොරොත්තු සඵල විය. තවද කේශ ධාතු තැන්පත් කොට චෛත්‍යයන් ඉදි වූ ඒ දේශය කේසවත නමින් ද හැඳින්විණ. ඡකෙසධාතුවංසයෙහි සඳහන් කතාව එතෙකින් අවසන් වේ.

මෙහි සඳහන් කේසවතී දේශය නම් කුමන දේශය දැයි අපි නො දනිමු. හැකියාව ඇත්තෝ එය පර්යේෂණය කරත්වා. මැනවින් සෙවුව හොත් එය යම් දිනෙක අනාවරණය වනු ඇත. තවද තථාගත කේශ ධාතු තැන්පත් කළ ස්ථාන ලංකාවේ ද තැනින් තැන වේ.

එමෙන් ම දැනුදු කැළණිය රජමහා විහාරයට යන ශ්‍රද්ධාවන්තයිනට එහි වන කෞතුකාගාරයෙහි ඇති ධාතු මන්දිරයේදී සර්වඥ කේශ ධාතු සියැසින් ම දැක බලා වන්දනා කර ගැනීමට අවස්ථාව ඇත. සැදැහැ සිත් ඇත්තෝ මේ සියල්ලෙහි නිරත වෙත්වා.



# බෞද්ධ මනෝචිකිත්සාව හා උපදේශනය පිළිබඳ ඓතිහාසික පසුබිම

ආචාර්ය කලයාණි රුවන්පතිරණ

PG.Dip Buddhist Āyurvedic Counselling (Hons),Dip. in Clinical Psychology
Head of Counselling Psychotherapy Unit

බුදු දහමට අනුව මිනිසාට වැළඳෙන රෝග කායික හා මානසික ලෙස වර්ග දෙකකි. කායික රෝගාබාධවලින් වැළකී වසර ගණනාවක් ජීවත් වීමට හැකි වුවත් මානසික රෝගාබාධවලින් නොපෙළී මොහොතක් හෝ සිටීම දුෂ්කර බව බෞද්ධ මතයයි. බොහෝ ලෞකික වස්තූන් කෙරේ ආශාවෙන් ඒවා තමන් සතුකර ගැනීමේ නිරන්තර උත්සාහයක යෙදෙන පුද්ගලයා ඒවා නොලැබීමෙන් දෛනිකව අතෘප්තිකර ජීවන රටාවක් ගෙවයි වර්තමානය වන විට පුද්ගලයා බරපතල ජීවන අරගලයක යෙදී ඇති අතර නිරතුරුවම මානසික ගැටලුවලට මුහුණ පායි. ඉන් යම් මානසික පීඩාකාරී බවක් දෛනිකව එකතු කරගන.

මෙලෙස එකතුවන මානසික අසහනයන් නිසා පුද්ගලයාගේ ලෝභ, දෝස, මෝහ ආදී ක්ලේෂයන් සංවර්ධනය වන අතර එසේ සංවර්ධනය වීමට වර්තමානයේ බලපාන කරුණු රාශියක් සායනික වාර්තා අනුව අපට තහවුරු වී ඇති ඒවා අතර බාල, මහලු, තරුණ ආදී වයස් භේදයකින් තොරව මානසික අසහනය වර්ධනය වන කරුණු ලෙස,

- ❖ දෙමාපියන් විදෙස්ගත වීම.
- ❖ දෙමාපියනට දූ දරු සෙනෙහස නොලැබී යාම.
- ❖ ළමා අපයෝජන.
- ❖ පෙම් සබඳතා ගිලිහී යාම හා විවිධ විෂය පථයන්ට යොමු වීම.
- ❖ තරගකාරී අධ්‍යාපන රටාව.
- ❖ දරුවන්ගේ රුචිකත්වයෙන් තොරව සිදුකර දෙන විවාහ හා රැකියා.
- ❖ දූ දරුවන්, සැමියා, බිරිඳ යන අය තම වගකීම් හා යුතුකම්වලින් බැහැරව දිගුකාලයක් අන්තර්ජාලයේ රැඳීසිටීම.
- ❖ වයෝවෘද්ධ දෙමාපියන් වැඩිහිටි නිවාසවල හුදෙකලාවීම.
- ❖ පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා තරුණ පිරිස් විවිධ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම.
- ❖ අධ්‍යාපනයට සරිලන රැකියාවක් හා වේතනයක් නොලැබීම.
- ❖ නවීකරණය වූ විවිධ රසකාරක හා ක්ෂණික ආහාර පානවලට හුරුවීමෙන් විවිධ කායික රෝගාබාධවලට ලක්වීම.
- ❖ දෛනික ජීවිතය සංකීර්ණ වීම හා මානසික නිදහස අවම වීම යනාදී සාධක ප්‍රධානස්ථානයේ ලා සැලකේ.

බෞද්ධ උපදේශනය හා මනෝචිකිත්සාවට ඓතිහාසික පසුබිමක් හා චිකිත්සාමය වටිනාකමක් ඇත. ඒ බව සූත්‍ර දේශනා, ජාතක කතා තුළින් මනාව අවබෝධ වේ. සල්ලේඛ සූත්‍රයේ මානසික ව්‍යාබාධ 44ක් සඳහන් වීම, පැරණිතම මනෝරෝග වර්ගීකරණයක් දරිමුඛ ජාතකයෙන් හමුවීම හා එම වර්ගීකරණය නූතන මනෝරෝග වර්ගීකරණය (ICD) සමඟ සැසඳිය හැකිවීම, පටාචාරා, කිසාගෝතමී යන අයගේ වියෝදුක හා විෂම චර්යාව නිරුද්ධ කිරීම, සුනීත, සෝපාක, රජ්ජුමාලා යන අයගේ චිත්තපීඩා සමනය කිරීම, නන්ද හිමිගේ විරහ වේදනාව සමනය කිරීම, ආලවක, අංගුලිමාල යන අයගේ ප්‍රචණ්ඩ ක්‍රියා සමනය කිරීම, සිරිමා ගණිකාවගේ මළ දේහය වෙන්දේසිකර පෙන්වීම, සතරපද ගාථාව අමතක වූ චුල්ල පන්තක හිමිට මානසික සැනසීම උදාකිරීම වැනි සාධක තුළින් අතීතයේ සාර්ථක මනෝචිකිත්සාවක් සිදුවී ඇති බව තහවුරු වේ.

අතීතයේ මනෝකායික රෝගාබාධ රාශියකට ද බෞද්ධ උපදේශන මනෝචිකිත්සා තුළින් සාර්ථක පිළියම් ලැබී ඇති ඒවා අතර,

01 උම්මග්ග ජාතකයේ කාවින්ද නම් පඬිවරයා මාසයේ එක්තරා දිනෙක පිස්සු බල්ලෙකු මෙන් හැසිරීම. (යක්ෂ උන්මාදය)

02 උම්මදන්ති ජාතකයේ, රජුට උම්මදන්තීගේ ආදරය දිනාගත නොහැකි වීමෙන් රජු තුළ උනන්දුව අඩුවීම, නිකරුණේ ඇවිදීම, ඇඳට වී සිටීම, නිදිවර්ජිතව සිටීම, උම්මදන්තිය ගැන සිතමින් හැඬීම, මරණය ගැන කතාකිරීම හා කුස ජාතකයේ කුස රජුට මෙවැනිම රෝග ලක්ෂණ පහළ වීම (ශෝකාදී මනෝභාවජ උමතුව - Psychogenic Mani)

03. මණිකුණ්ඩල ජාතකයේ බෝසතුන් අසාධාරණ ලෙස සිරගත කිරීමෙන් ශරීරයේ වේදනාව ඇතිවීම් (මනෝමූලික වේදනා - Psychogenic Body Pains)

04. කේසව ජාතකයේ රජුට තම බිරිඳ පලාගිය පසු හටගත් පාචනයී (මනෝමූලික පාචනය - Psychogenic Diarrhe) යනාදිය දැක්විය හැකිය.

05. පෞරුෂ ව්‍යාබාධ හා අපගාමී ලිංගික චර්යා පිළිබඳ දත්තයන් ද ජාතක කතා තුළින් අනාවරණය වේ. සලිත්ත ජාතකයේ පුරෝහිතයාගේ මුඛරි බව එළුබෙටි මුඛයට විදීමෙන් සුවවීම, චුල්ල ධර්මපාල ජාතකයේ රජු මාලිගයට එන විට බිසව නොනැගිටීම නිසා සිය දරුවාගේ හිස ගසාදැමීම, බාහිය ජාතකයේ අපගාමී ලිංගික චර්යා පෙන්වීමද (මළපහ කිරීම දකින විට ඇතිවන ලිංගික ආශාව, මුත්‍රා පිට කිරීම දකින විට ඇතිවන ලිංගික ආශාව දැක්විය හැකිය)

06. කුණාල ජාතකය තුළින් පෙන්වන අපගාමී ලිංගික චර්යා ලෙස,
අධික කාමාශාවෙන් යුතු වීම.
ලිංගික හැසිරීම් හොරෙන් බලා සිටීම.
ලිංගිකත්වය ප්‍රදර්ශනය කිරීම.
ආබාධිතයන් සමග ලිංගිකව හැසිරීමට ඇති අසාමාන්‍ය ආශාව ද

07. කච්ජප ජාතකයේ මුඛ සංසර්ගය කර්ණ සංසර්ගය පිළිබඳ දත්තයන්ද සඳහන් වීමෙන් මනෝරෝග පිළිබඳ පුළුල් වර්ගීකරණයක් අතීතයේ තිබූ බව පැහැදිලි වේ. එසේම මනෝමූලික රෝගාබාධ අතීතයේ බෞද්ධ මනෝචිකිත්සාව තුළින් ඉතා සාර්ථක ලෙස විසඳා ඇති බව පහත සඳහන් චිකිත්සා ක්‍රම අධ්‍යයනයන් තුළින් පැහැදිලි වේ.

01. **කිසාගෝතමී** - මළ දරුවෙකුට ප්‍රතිකාර ඉල්ලමින් ඇවිදීම හා බොහෝ දෙනාගේ නින්දා අපහාසවලට ලක්වීම. මෙහිදී තම එකම දරුවාට දැක්වූ දැඩි ඇල්ම නිසා තමා ප්‍රිය කළ වස්තුව අහිමිවීමෙන් ඇති වූ දැඩි කම්පනයෙන් මානසික සමබරතාව ගිලිහී ගොස් විකෘති චර්යාවක් ඇතිවී ඇත. (මානසික සමබරතාව ගිලිහී ගොස් විකෘති චර්යා ඇතිවීමට යම් අරමුණකට ඇති බලවත් ප්‍රියතාවය හේතු වේ. ම.නි. ප්‍රියජාතික සූත්‍රය) නිවසින් නිවස කරා ගමන් කිරීමේදී යම් කාලයක් වැයවන අතර කාලය සමඟ ශෝකය ලිහිල් වීමද මරණය පොදු ධර්මතාවක් බව ඇයටම අවබෝධ වීමට සලස්වා ඇත.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

- ▪ කාරුණිකව ආමන්ත්‍රණය කිරීම.
- ▪ අභියෝගය බාරගැනීම.
- ▪ නොමළ ගෙයකින් අබ ගෙන ඒමට නිර්දේශ කිරීම.
- ▪ රෝගියා යථාර්ථයට සමීප කරවීම.
- ▪ යථාර්ථය දැකීමත් සමඟ යෝනිසෝමනසිකාරය ඇතිකිරීම.

මෙම චරිතය රාග චරිතයක් වන අතර, කාමයන්ගේ ආදීනවය දැකීමට සලස්වා ඇත.

02. **පටාචාරා** - සිටු දියණියක වූ පටාචාරාට සැමියා, දරුවන් දෙදෙනා, දෙමාපියන් සහෝදරයන් සියල්ල අහිමිවී යාම. මිනිසුන්ගේ ගල්, මුල් ප්‍රහාරවලට ලක්වීමීදෙමාපිය දූ දරුවන් හා සැමියා පිළිබඳව දැඩිව ග්‍රහණය කරගෙන සිටි කාමාදී අරමුණු වැනසීයාම හා රැකවරණය අහිමිවීමත් සමග ඇතිවූ දැඩි චිත්තාවේගී තත්ත්ව සමග ඇතිවූ මානසික විකෘතියකි. ක්ලේෂ කාමයන් කෙරේ දක්වූ බලවත් ප්‍රියතාව හේතුවේ.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

- සැනසිලි දායක ආමන්ත්‍රණය මතකය හා සිහි කල්පනාව අවදි කිරීමට හේතු වී ඇත.
- නිරුවත දැකීමත් සමග යෝනිසෝමනසිකාරය අවදි වී ඇත.
- අනපේක්ෂිත ලෙස ඇති වූ තීව්‍ර වූ ක්ෂණික ආතතිකාරකයන් නිසා මතකය හා සිහිකල්පනාව අහිමි වුවද පැය 24 - 48 කාලය තුල එය ස්වාභාවිකව අවදි වේ. එසේ අවදි වීමට බුදු හිමිගෙන් ලැබුණු බාහිර අරමුණ වූ සැනසිලි දායක වදන් හේතු විය.

(උපදේශනය මානසික ප්‍රතිශක්තිය
නංවාලිය හැකි ප්‍රතිකාරයකි)

03. **නන්ද හිමි** - ගිහි ජීවිතය තුළ ජනපද කල්‍යාණි සමග පෙම් සබඳතාවක් ගොඩ නැගී තිබූ අතර බුදු හිමිගේ ඉල්ලීම ඉවත දැමිය නොහැකිව සසුන් ගත වුවද මනස එක්තැන් කිරීමට අපහසුව භික්ෂු ජීවිතය තුළ සුවඳ විලවුන් ගල්වමින් පිණ්ඩපාතයේ වඩිමින්, ජනපද කල්‍යාණිය ගැන සෝ සුසුම් හෙළමින් දැඩි චිත්ත පීඩාදියෙන් පසුවීම. ජනපද කල්‍යාණියගේ රූපයට වඩා පරිපූර්ණ රූ සපුවෙන් යුතු දිව්‍යාංග නාවන් මවා පෙන්වා ජනපද කල්‍යාණිය වැඳිරියකට උපමාකර, භාවනා කිරීමෙන් දිව්‍යාංගනාවන් ලබා ගත හැකි බවට තිබූ බලාපොරොත්තුවට වඩා වැඩි බලාපොරොත්තුවක් සිත තුළ ඇති කිරීම.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

මෙහිදී රාගයෙන් මත් වී තිබූ සිතට ඊටත් වඩා වැඩි රාගාදී අරමුණක් ලබා දී යම් අරමුණක් දැඩිව ග්‍රහණය කරගැනීමට සලස්වා ඒ අරමුණ ඉටුකර ගැනීමට නම් නිර්දේශිත ක්‍රියාමාර්ගය භාවනාව බව පැහැදිලි කර ඇත. කාමරාගාදියෙන් ගිනිබත් සිතට දිව්‍යාංගනාවන් ලබා දෙන බව නොපවසා භාවනාව නිර්දේශ කළේ නම් භාවනාව කිරීමට උනන්දු නොවී එය අතරමග නතර විය හැකිය.

බුදු දහමට අනුව පුද්ගලයා උමතු කරවන ප්‍රබල මනෝ විකෘතිකාරකයක් ලෙස අයෝනිසෝමනසිකාරය හැඳින්විය හැකිය. මෙම අයෝනිසෝ මනසිකාරය අයහපත් චර්යාවන් වර්ධනයට හේතුවන බැවින් එම අයෝනිසෝ මනසිකාරය නිසා නන්ද හිමිට සිත එකතැන් කරගත නොහැකි චිත්ත අරගලයක යෙදී සිටි බැවින් යෝනිසෝමනසිකාරය ඇති කිරීමේ අරමුණින් භාවනාව නිර්දේශ කර ඇත. භාවනාව තුළින් සිත සමාධි ගත වී නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාරී වූ බැවින් ප්‍රථමයෙන්ම දිව්‍යාංගනාවක් පෙන්වා ප්‍රබල අරමුණක් සිතට ලබා දී භාවනාවට යොමු කර ගැනීමේ පසුබිම සකසා ගෙන ඇත. ඒ තුළින් චිත්ත ඒකාග්‍රතාවය ඇතිකර ගැටලුවට විසඳුම ලබාදී ඇත.

04. **ආලවක චරිතය** - මොහු ඔහුටම වෙන් වූ විමාන සකසා ගෙන ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු යක්ෂාවේෂයක් ගත් පුද්ගලයෙකි. බුදුහිමියන් ආලවක යක්ෂයා නොමැති වේලාවක ඔහුගේ විමනට වැඩම කර ඔහුගේ සිහසුනේ අසුන් ගැනීම. එවිට "ශ්‍රමණය" එළියට යව, ඇතුළට එව, යන විදාන ආලවක යකු දෙන විට ඒවාට අවනතව ක්‍රියා කිරීම.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

වීතරාගී, වීත මෝහී, වීත දෝසි වූ බුදුහිමියන් එවැනි කිසිදු පලයක් නෙළා නොගත් පෘථග්ජන මිනිසකුගේ අණ ඉවසීමෙන් පිළිගෙන, ගැටුම් ඇතිකර නොගෙන ප්‍රචණ්ඩ පෞරුෂය මෙල්ල කර ධර්ම දේශනා කිරීමට අවශ්‍ය පසුබිම සකසා ගැනීම, ඒ තුළින් කරුණු අවබෝධ කර දීමට හැකිවීම.

05. **අංගුලිමාල චරිතය** - උගත් බුද්ධිමත් තරුණයෙකි. තම ගුරුවරයා නිර්දේශ කරන ලද පැවරුම වූ ඇඟිලි 1000 කපා මාලයක් සාදා පූජා කිරීමට මනුෂ්‍යන් මරමින් ගම්, නියම් ගම්වල සැරි සැරූහ. බුදුරජාණන් වහන්සේ පසුපසද හඹා ගොස් ළංවීමට නොහැකි තැන නවතිනු ලෙස බුදුහිමිට විදාන දී ඇත. "මම නැවතුණා" ඔබ නවතින්න යන ලෙස ගමන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

මෙහිදී පුද්ගලයාට සිතන්නට ඉඩ සලසා දී ඇත. බුද්ධි චරිතයක් බැවින් කෙටි පිළිතුර උපදේශනයක් වී ඇත. ගමන් කරමින් සිටි බුදුහිමියන් නැවතුණා යැයි පිළිතුරු දීමෙන් එසේ පැවසීමට හේතුව බුද්ධිමත් තරුණයෙකු වූ අංගුලිමාල සිතන්නට විය.

06. **සිරිමා ගණිකාව** - ඉතා සුරූපී නගර සෝභණියක වූ සිරිමා නම් කාන්තාව ඉතා ධනවත් කුලවත් සෑම දෙනාගේම වසඟයට ලක්ව කාම සේවනය කරමින් දිවි පෙවෙතක් ගත කිරීම. භයානක සමාජ රෝග යකට ගොදුරුවී ඇත. දැඩිසේ රෝගාතුර වූ ඇයගේ රූ සපුව වැහැරී දැඩි ශාරීරික වේදනාවන් ඇතිවෙමින් දෛනික වැඩ කටයුතු කිරීම අපහසු වෙමින් ජරා ජීර්ණ තත්වයට පත්ව මියැදෙන්නට විය. මෙම සුරූපිණියගේ මළ දේහය ආදාහනය හෝ භූමදානය කිරීමට නොදී කනත්ත තුළ වෙන්දේසි කර පෙන්වීම.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

මළ දේහය වෙන්දේසි කිරීම පටන් ගැනීමේදී මුලින්ම ඉතා වැඩි මුදලකට වෙන්දේසි කළද කිසිවෙක් ඇය බාර නොගැනීම. දෙවන පියවරේදී ඊට වඩා අඩු මුදලකට එය වෙන්දේසි කිරීම. ක්‍රමයෙන් මිල අඩු කරගෙන ගොස් අවසාන පියවරේදී එය රුපියලකට වෙන්දේසි කිරීම. මෙසේ වෙන්දේසි කළ රුපියලකට හෝ එම සිරුර භාරගැනීම කිසිවෙකු ඉදිරිපත් නොවීම. මෙම සිද්ධාන්තය තුළින් නිරෝගී රූ සපුවෙන් සිටියදී ඇය දහස් ගණනින් මිලදී ගත් කිසිවෙකු බාර නොගැනීමෙන් එවැනි කාමසේවනයන්ගේ යෙදෙන අන් අයට ආදර්ශයක් සපයා ඇත. කාම රූපාදී වින්දනයන්ගේ ආස්වාදය, ආදීනවය හා නිස්සරණය යන ලක්ෂණත්‍රය පිරිසිද දැකීමට සලසා ඇත.

07. **චුල්ල පන්තක හිමි** - මහණ වී සිටි චුල්ල පන්තක හිමිට මාස හතරක් යන තෙක් සතර පද ගාථාව පාඩම් නොසිටීම. සසුන් ගත වී සිටි තම වැඩිමහල් සොහොයුරා ඔහුව සාසනෙන් නෙරපා දැමීමට තීරණය කිරීම නිසා දැඩි චිත්ත පීඩාවට ලක්වීම. බුදු හිමියන් ඉතා පිරිසිදු රෙදි කඩක් අතට දී "රජෝහරං" යන පදය කියමින් එය පිරිමැදීමට සැලැස්වීම. මෙසේ දිගටම පිරිමැදීමේදී අලුත් රෙදිකඩ ඉතා අපිරිසිදු වීම.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

දිගින් දිගටම එකම අරමුණක සිත පිහිටුවා ගැනීමට සලස්වා ඇත. සරල අභ්‍යාසයක් දීම තුළින් එය පහසුවෙන් හා කම්මැලි නැතිව කිරීමට පසුබිම සකසාදීම.

ශාසනයෙන් ඉවත් කරාවි යන බිය දුක සමග සිතට ආ මානසික පීඩනය එක අරමුණක සිත පිහිටුවීමට කටයුතු කිරීමෙන් අඩුකිරීම. චිත්ත ඒකාග්‍රතාවය තුළින් සමාධිය කරා සිත ගෙන ගොස් ඒ තුළින් රහත් වීමට අවශ්‍ය පුණ්‍ය ශක්තිය ලබාදීම.

08. **යසෝධරා දේවිය** - බුදුහිමියන් කිඹුල්වතට පැමිණි අවස්ථාවේදී යසෝදරා දේවිය දැකීමට ඇයගේ කුටිය වැඩම කළ අවස්ථාවේදී ඇයට දෙපාළඟ වැටී දෙපාවල එල්ලී හඬාවැටීමට ඉඩ දෙන ලෙස ශ්‍රාවකයන්ට දන්වීය යසෝදරා දේවියගේ සිතේ දිගුකාලීනව සිරකරගෙන තිබූ වේදනාව පහ වීමට සැලැස්වීම.

## නිර්දේශිත බෞද්ධ මනෝ ප්‍රතිකාර

වේදනාව පහවීමට සැලැසීම තුළින් මනෝ විරේචනයක් වීමට ඉඩ සලසා දීම. එවිට මනසට සහනයක් ලබා දීම (Catharsis)

09. ඒ ඒ චරිතයට හා බුද්ධි මට්ටම අනුව ඍජුවම, කොටස් වශයෙන්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාර්ග භාවිතා කර උපදෙස් ලබා දීම.

- අංගුලිමාලට කෙටි පිළිතුරක් ලබාදීම - කෙටි පිළිතුර තුළ සිතන්නට සැලැස්වීම.
- ඛේමා බිසවට - රූප රාමු තුළින් රූපයේ අනිත්‍ය බව වටහා දීම.
- ජන්න හිමි - හුදෙකලා කිරීම තුළින් පාඩමක් ඉගැන්වීම.

10. **විශාලා මහනුවර පැවති තුන්බිය පරිත්‍රාණ දේශනා තුළින් දුරුකිරීම**. - මුලදී කුසගින්නෙන් මිනිසුන් මියයෑම. එය දැක ජීවත් වූ අයගේ ධෛර්යය හීන වීම් එය තුන්බියක් දක්වා වර්ධනය වීම. ගණ, මාත්‍රා, අක්ෂර යම් ශාස්ත්‍රීය රටාවකට ඒකරාශී කර ශබ්ද විද්‍යාවන්ට අනුව ගුණ ලැබෙන ලෙස සකස් කර ඇත.

- මේ තුළින් සබ්බ භය, සබ්බ රෝග, සබ්බ දෝස විනාශ වීම අපේක්ෂාවයි.

# රජගලින් හමු වූ ලංකාවේ විශාලතම ගල් පාත්‍ර

- ආචාර්ය අශෝක කරුණාරත්න -

නැගෙනහිර පළාතට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජගල තැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රජගල කන්ද ඓතිහාසික වැදගත්කමක් හිමිකරගන්නා පුණ්‍ය භූමියකි. අතීත බෙදීම් අනුව රජගල කන්ද පුදබිම රුහුණු රටට අයත් බව මූලාශ්‍රගත තොරතුරු අධ්‍යයනයේදී පැහැදිලි වේ. රජයේ මිනුම් දෙපාර්තමේන්තුව අනුව 1968.09.28 වන දින රජගල පුරාවිද්‍යා රක්ෂිත භූමිය අක්කර 1025 පර්චස් 16ක් ලෙස බෙදා වෙන් කළ අතර 1977.02.14 දින නැවත මිනුම්ගත කිරීම් අනුව එය අක්කර 1025 භූමියක් අයත් බව නැවත තහවුරු කර ඇති වර්ෂ 2015 දී රජයේ මිනුම් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව එය අක්කර 993 ක් ලෙස ගණනය කරන ලදි.

දකුණේ සිට උතුරට විහිදී යන කඳුගැට කිහිපයකින් සමන්විත රජගල පුරාවිද්‍යා භූමිය පුරා පැතිරුණු විශාල ප්‍රමාණයේ ගල් තලා, ගල් පර්වත, ස්වාභාවික පිහිටීම් අනුව ගල් කුළුණු බහුලව දකිය හැකිය. මුහුදු මට්ටමේ සිට අඩි 1038ක් පමණ උස මෙම කඳු වැටිය පුරාම භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගනිමින් උපයෝගීතාව අනුව බෞද්ධ ආරාමික ගොඩනැගිලි විසිරී පැවති අයුරු හඳුනාගත හැකිය. කඳු පංතියේ නැගෙනහිර අන්තයට වන්නට ඇතැම් තැන්හි ශීඝ්‍ර බෑවුම් පවතින අතර බටහිර අන්තයට වන්නට තරමක් දළ බෑවුමක් ද දක්නට හැකිය. සමස්තයක් ලෙස ගත් කල මුළු භූමිය පුරාම විවිධ භූ විසමතා ලක්ෂණයන් හඳුනාගත හැකිය.

කඳු මුදුනේ වර්ෂය පුරාම නොසිඳී ජලය ගලා යන දිය පහරක් ආසන්නයෙහි විශාල ගල් පාත්‍ර දෙකක් හමු වී ඇත. පාත්‍ර සඳහා ජලය ලබා ගෙන ඇත්තේ එම නොසිඳී ගලා හැලෙන සිසිල් කුඩා දිය පහරකින් බව අවට පුරාවිද්‍යාත්මක සාධක තවමත් පිහිටි ගලෙහිම සටහන්ව තිබීමෙන් පැහැදිලි වේ. ග්‍රැනයිට් පාෂාණයෙන් සකසන ලද ගල් පාත්‍ර දෙකක් එම ස්ථානයෙන් හඳුනාගත හැකි අතර ඉන් එක් පාත්‍රයක් සැලකිය යුතු ආරක්ෂිත මට්ටමේ ඇත.

ආරක්ෂිත මට්ටමේ ඇති ගල් පාත්‍රයේ ප්‍රමාණාත්මක විශ්ලේෂණය අනුව මුව විට විශ්කම්භය 133 cm කි. ගැඹුර 74 cm ක් වන අතර පාත්‍රයේ ඝනකම විවිධාකාර ලෙස හඳුනාගත හැකිය. මුවවිට ඝනකම 7 cm වන අතර පතුලට වන්නට ක්‍රමයෙන් ඝනකම වැඩි වූ අයුරක් දකගත හැකි වේ. විශාල ජල ප්‍රමාණයක් රඳවාගත හැකි පරිදි වැඩි වපසරියකින් ගල් පාත්‍රය නිර්මාණයකොට ඇති අයුරු දකගත හැකි ය.

දෙවන ගල් පාත්‍රය කැබලි ගණනාවකට කැඩී ඇත. විශේෂයෙන්ම පසුකාලීන මානව ක්‍රියාකාරකම් නිසා වූ ක්‍රියාවක් බව ගම්‍ය වන අතර වර්තමාන පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු නිසා එම ගල් පාත්‍රය සඳහා වන මැදිහත් වීම් කටයුතු සිදුකරමින් පවතී. එහි මුවවිට විෂ්කම්භය 121 cm ක් වේ. ගැඹුර 81 cm ක් වන අතර ගල් පාත්‍රයේ විවිධාකාරය. මුවවිට ඝනකම 10 cm කි.

මෙම ගල් පාත්‍ර දෙක ප්‍රමාණාත්මක හා බාහිර නිර්මාණාත්මක ස්වරූපය අනුව ද විසමතා හඳුනාගත හැකි වේ. සංරක්ෂිත තත්ත්වයේ පවතින ගල් පාත්‍රය දැනට විනාශ වී ඇති ගල් පාත්‍රයට වඩා උසින් අඩු ය. බැලූ බැල්මට අර්ධ ගෝලාකාර ස්වභාවයක් දකගත හැකිය. එම පාත්‍රයේ මුවවිට වටා අඟල් 1½ ක් පමණ ඝනකම රේඛාවක් දැකිය හැකි වේ. මනා වූ නිමාවක් දැකිය හැකි මෙම ගල් පාත්‍රයෙහි ඝනකම දෙවන ගල් පාත්‍රයට වඩා අඩු ය. දෙවන ගල් පාත්‍රය ඉලිප්සාකාර ස්වරූපයක් දරන අතර පළමු ගල් පාත්‍රයට වඩා මුව විට විෂ්කම්භය අඩුය. (121cm, 133cm) එම පාත්‍රය රළු නිමාවකින් යුක්ත වේ.



පාත්‍ර දෙක සැලසුම්සහගතව සකසන ලද මණ්ඩපය සහිත විශේෂ ගෘහයක් තුළ සකසන ලද බවට සාධක ඇත. එසේම එම පාත්‍ර දෙක සඳහා ජලය සැපයූ ජල මාර්ග පද්ධතියක සාධක ද කැණීම්වලින් අනාවරණය වී ඇත. මින් පෙනී යන්නේ විශේෂ කාරණයකට සකසා ඇති බවය. ඒ අනුව මෙය ආරාමික භික්ෂූන්ගේ දෛනික ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම අරමුණු කොටගෙන ජලය ගබඩා කොටගත් බඳුන් දෙකක් ලෙස මෙම පාත්‍ර දෙක හඳුනාගත හැකිය. මේ අනුව මෙම පාත්‍ර දෙක දොරටු සහිත ජල මණ්ඩපයක් තුළ ආරක්ෂිතව තැන්පත් කර ඇති බවක් පෙනී යන හෙයින් පිරිසිදු ජලය පානය කිරීම අරමුණු කොටගෙන අපද්‍රව්‍ය ආදිය එක් වීම වැළැක්වීම සඳහා මෙසේ තැන්පත් කරන බව සිතීමට හැකිය. මෙහි තවත් විශේෂත්වයක් වන්නේ ජල පිහිල්ල මඟින් ගලා එන ජලයෙන් පාත්‍ර පිරී ගිය පසු ඉවත් වන ජලය සහ ජලය පරිහරණය කිරීමේදී ඉවත් වන ජලය ක්‍රමානුකූලව කුටියෙන් පිටතට ගලා යෑම බිම් මට්ටමෙහි සකසන ලද ගල් කාණු පද්ධතියක් දකගත හැකිය. එම ජල පිටතට ගලා එන ස්ථානයෙහි (මකර මුඛය) තුළින් ජලය පිටතට වැස්සෙන පරිදි නිර්මාණයකොට තිබීම ද කලාව හා තාක්ෂණය එක්කරගත් සුවිශේෂ අවස්ථාවක් ලෙස දක්වීමට හැකිය.

මෙබඳු දොරටු පැන් මඩු පිළිබඳව ක්‍රි. ව. 9 වන සියවසට පමණ අයත් අනුරාධපුර බෞද්ධ වැට පුවරු ලිපියේ ද තොරතුරු අනාවරණය වී ඇත. එම ලිපියට අනුව ජලය ආරක්ෂිතව තැම්පත් කළ දෙමහල් මණ්ඩපයක් තිබී ඇති අතර එහි පාරිශුද්ධභාවය ආරක්ෂා කිරීමට අවශ්‍ය නීති රීති පවා පනවා තිබී ඇත. මෙයද එබඳු දොරටු පැන් මඩුවක් බව ඒ අනුව සිතිය හැකිය. මෙහි විශේෂත්වය වන්නේ ලංකාවේ මෙතෙක් කිසිදු ආරාම සංකීර්ණයකින් හමු නොවූ ගලින් කළ දැවැන්ත මෙම පාත්‍ර නිර්මාණය වී තිබීමයි. වතුර පුරවා තැබීම සඳහා ගලින් කළ හතරැස් ස්වරූපයේ බඳුන් අනුරාධපුර ථූපාරාම ප්‍රධාන දොරටුව අභියසත්, මිහින්තලෙන් ද දකගත හැකි වුවත්, මෙබඳු විහාල පාත්‍ර හමුවන එකම ස්ථානය රජගල බව සඳහන් කළ හැකිය.

# දෙවියන් දැකිය හැකිද ?

- නාලක ජයසේන -

දර්ශනයේ මූලික ප්‍රශ්නයක් වන්නේ විශ්වයේ මූල තත්ත්වය කවරක්ද යන්නයි. එය හුදු ද්‍රව්‍ය පදාර්ථයක් පරම කර ඇතැයි ගැනීම භෞතිකවාදයයි. මනෝමය පදාර්ථයකින් ඒ හට ගන්නේ යැයි සිතීම විඥ්ඥාණවාදයයි. විඥ්ඥාණවාදය ප්‍රභේද ද්වයකි. විෂය මූල විඥ්ඥාණවාදය යනු මිනිස් චිත්තයෙන් ස්වාධීන ජගත් විඥ්ඥාණයක් හෝ සර්වබලධාරී දෙවියකු ඇති බවයි. මනෝමූල විඥ්ඥාණවාදය යනු බාහිර ලෝකය යනු චිත්ත නිර්මිතයක් බවයි. දෙවියන් සිටීද නැද්ද යන්නට පිළිතුරක් සෙවීමේදී මෙකී මූලික සිද්ධාන්තය පළමුව අවබෝධ කරගත යුතුය. බියෙන් තැතිගත් මිනිසුන් ගස් ගල් සරණ යෑම මානව ශිෂ්ටාචාරයේ ආගමික සංස්ථාව ඇතිවීමට හේතුවයි. ස්වභාවික වස්තු දේවත්වයෙන් පිදූ බහුදේවවාදය පසුව ඒකදේවවාද වශයෙන් සංකීර්ණ ආගම් නාමයෙන් විද්‍යමාන විය. දෙවියන් සිටීද නැද්ද යන්නත් දෙවියන්ට මිනිසුන්ට උදව් කළ හැකිද නැද්ද යන්නත් දෙවියන් සිටීනම් විද්‍යාවට ගෝචර වීම හෝ නොවීමට හේතු කවරේද යන්නත් සංවාදාත්මකය. එක්තරා සංවාදාත්මක වැඩසටහනකදී මතු වූ අදහසක් නම් දෙවියන් සිටී නම් රොයිටර් පුවත් සේවය ඉදිරියේ දෙවියන් තත්පර දහයක් පෙනී සිටින්නේ නම් මේ ගැටලුවට පිළිතුරු ලැබෙන බවයි.

දෙවියන් සිටීදැයි ප්‍රශ්න කරන්නාවූ පිරිසගෙන් ලාංකේය සමාජයට සිදුවන බරපතල මතවාදීමය අනතුරක් මෙහිලා හෙළි කරමු. අප සංස්කෘතියේ පරම චේෂ්ඨාව වන්නේ නිවනයි. එනම් නිකෙලෙස් විමුක්තියයි. එයද දෙවියන් හසුනොවෙතැයි කියන බටහිර ඊනියා විද්‍යාවට අගෝචරය. දෙවියන් නැතැයි කියමින් මතවාද සමාජගතකොට තරුණ පරපුරේ චින්තනය අතරමංකරන පිරිස අවසානයේදී නිවනත් අවිද්‍යාත්මකයැයි කියන දිනය මතු පැමිණීමට පෙර සත්‍ය හෙළි කළ යුතුව ඇත. බටහිර විද්‍යාව යනු සපුරාම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ මත පදනම්ව ඇත. එහෙත් ඔවුන් ඒ ප්‍රත්‍යක්ෂ පැහැදිලි කිරීමට යොදාගන්නා සංකල්ප සියල්ලම මනෝමය වෙයි. නිදසුනක් ලෙස ඉලෙක්ට්‍රෝන දුටු අයෙක් හෝ එය දැකිය හැකි උපකරණයක් නැත. එම සත්‍ය වටහාගැනීමට බටහිර විද්‍යා උපාධියක් අවශ්‍ය නැත. එසේම බටහිර විද්‍යාව මත පදනම්ව ගොඩනැගී ඇති සාමාජීය විද්‍යාත්මක විධික්‍රමය ඔස්සේ සමාජය විග්‍රහ කරගැනීම අර්ථශූන්‍ය වන්නේය. සමාජය පර්යේෂණාගාරයක් වශයෙන් සැලකීමේදී ගතික මානව චෛතසික පරම්පරාව නිරීක්ෂණය කළ හැකි මාන කවරේද? එසේ නම් මානව ශාස්ත්‍ර වශයෙන් ලෝකය තුළ ඇති සියලු දැනුම හුදෙක් ප්‍රවාද පමණි. සමාජ විද්‍යාව මගින් සිදුකරනුයේ එම ප්‍රවාද පාදක කරගෙන යම් යම් පුරෝකථන ඉදිරිපත්කරණයයි.

"දෙවියන් සිටීදැයි ප්‍රශ්න කරන්නාවූ පිරිසගෙන් ලාංකේය සමාජයට සිදුවන බරපතල මතවාදීමය අනතුරක් මෙහිලා හෙළි කරමු" අප සංස්කෘතියේ පරම චේෂ්ඨාව වන්නේ නිවනයි" එනම් නිකෙලෙස් විමුක්තියයි" එයද දෙවියන් හසුනොවෙතැයි කියන බටහිර ඊනියා විද්‍යාවට අගෝචරය" දෙවියන් නැතැයි කියමින් මතවාද සමාජගතකොට තරුණ පරපුරේ චින්තනය අතරමංකරන පිරිස අවසානයේදී නිවනත් අවිද්‍යාත්මකයැයි කියන දිනය මතු පැමිණීමට පෙර සත්‍ය හෙළි කළ යුතුව ඇත"

මෙකී ප්‍රවේශය පදනම් කරගෙන දේව ප්‍රපංචය කවරේදැයි හඳුනාගත යුතුය. දෙවියන් යනුද මිනිසුන් මෙන් සසර සරන සත්ත්ව කොටසකි. මිනිසුන්ට මෙන්ම දෙවියන්ටද චින්තනයක් ඇත. ඒ අනුව සම්මා දිට්ඨික හා මිච්ඡා දිට්ඨික ලෙස දේව ප්‍රභේද දෙකකි. බුදුරජාණන්වහන්සේ දේවාතිදේව බ්‍රහ්මාතිබ්‍රහ්ම වන්නේ දෙව් මිනිස් සැම සතු කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයිනි. දෙවියන් සාමාන්‍ය මානව ඇසට ගෝචර නොවේ. එහෙත් මිනිසුන් අතර සිටින සිත දියුණු කරගත් මිනිසුන් හට දෙවියන් දැකිය හැකි සේම දෙවියන් හා සන්නිවේදනය කළ හැකිය. දෙවියන්ගෙන් උපකාර පැතීමට මිනිසුන් යොමුවන්නේ මානසිකව අසරණ වූ විට විය හැකිය. නමුත් දෙවියන්ට මිනිසුන්ට වක්‍රව උපකාර කළ හැකිය. මෙරට සාපලත් යුද්ධය අවසන් කරන්නටද ලෝකපාලක දේවාශීර්වාදය ලැබිණ. එය කියූ සැණින් වසර තිහක් එම දෙවිවරු සිටියේ කොහිදැයි තර්කශාස්ත්‍රය දන්නකු ප්‍රශ්න කළ හැකිය. එයට පිළිතුර යනු දෙවියන් යනුද මිනිසුන් මෙන්ම සත්ත්ව කොට්ඨාශයක් පමණක් බවත් දෙවියන්ගේ මැදිහත්වීම්ද අවස්ථානුචිතව සිදුවන බවත්ය. එපමණක් නොව දෙවියන්ගේ වෙසින් පෙනී සිටින නොමිනිස් බලවේග විසින් අහිංසක මිනිසුන් නොමග යවන අවස්ථාද බෙහෙවි. ඊනියා නියැදි පිරික්සන ඇතැමෙක් එවැනි ව්‍යාජ සිද්ධි උපයෝගී කරගෙන දෙවියන් නැතැයි කටමැත දොඩවනු පෙනේ.

කෙසේ නමුත් අප අවබෝධ කරගත යුතු සත්‍ය වන්නේ මේ පොළොවෙන් දේවසංකල්පය අතුගා දැමීම ඊනියා පඬිවරු කොතෙක් තැත් කළද මෙරට ජනතාව දේවවිශ්වාසයෙන් මුදවා ගත නොහැකි බවයි. දෙවියන් වන්නේද මිනිස් සිතමය. බුදුසමය දේවවන්දනය අනුමත නොකළද දේවතානුස්සතී භාවනාව නිර්දේශ කර ඇත්තේ දෙවියන් දැකීමටය. දේවතානුස්සතී භාවනාව යනු සීලයක පිහිටි මිනිසා අනතුරුව තම ගුණය ඔස්සේ තුන්ලොවටම මෛත්‍රිය විහිදුවාලමින් කරනු ලබන මානසික අභ්‍යාසයකි. කෙසේ නමුත් අනිත්‍යයට එකඟව අද්‍යතන සමාජයේ අධ්‍යාත්මය අවපතනය ආරම්භ වී ඇත. වැව් දාගැබ් බැඳ දියත ජය නැංවූ අපේ ජාතිය ආධ්‍යාත්මික ශක්තියෙන් පිරිහෙන්නේ නිති භාවනාව සමාජයෙන් ගිලිහුණු හෙයිනි. දෙවියන්ද අප කෙරෙන් ඈත්වීමට ඒ හේතුවකි. දෙවියන්ට අවශ්‍ය රොයිටර් වැනි බටහිර මාධ්‍ය වල පෙනී සිටිමින් ආශ්චර්යවත් දේකර පෙන්වීමට නොව සමාජය සිල්ගුණ සුවඳෙන් සපිරෙනු දැකීමටයි. බටහිර ඊනියා ස්වභාවික හෝ සාමාජීය විද්‍යා මගින් මිනිස් සන්තානයේ ඇති සනාතන ගැටලුව විසඳිය නොහැකිය. චිත්ත සාමය ඔස්සේ පෞද්ගලිකව ලබන විමුක්තිය ඔස්සේ ගොඩනැගෙන සමාජ සහසන්ධානය මගින් පමණක් අපේ ජාතිය පෙර මෙන් ලෝකයේ බලවත් රාජ්‍යයක් කරන්නට නම් අප සතුව ඇති එකම විකල්පය ආධ්‍යාත්මික එකක් බව අවබෝධ කරගත යුතුව ඇත.

ලිපිය අවසන් කරන්නට මතු දෙවියන් සිටීද නැද්ද යන්න ගැන බටහිර ඊනියා විද්‍යාත්මක ක්‍රමවේදයෙන් නොව තම තම නැණ පමණින් දත හැකි මාවතේ පළමු පියවර හෙළි කරමි. ලියුම්කරු පාසල් අවදියේ සිටම එම ආධ්‍යාත්මික ශක්තිය අත්දැක ඇත. එය ලියුම්කරුට හෙළිකළ දෙවියන් සමග සබැඳිතා ඇති කර්මස්ථානාචාර්යවරයා මෙකී ක්‍රමවේදය පිළිබඳ ආචාර්ය උපාධියක්ද හදාරමින් සිටියි. දේව මණ්ඩලයේ සිටින ආර්ය මෛත්‍රෙය නාථ දෙවියන්ට විශේෂ ස්ථානයක් හිමිවන්නේ උන්වහන්සේ මතුබුද්ධත්වයට අවශ්‍ය පාරමී දැන් සම්පූර්ණ කර ඇති හෙයිනි. ඔබ සීලයක පිහිටා උන්වහන්සේ වෙනුවෙන් පහනක් දල්වා ඔබසතු සීලාදී ගුණ සම්මර්ශනය කරමින් සිත සමාධිගත කරගන්න. එවිට විශ්ව ශක්තිය ඔස්සේ සම්මාදිට්ඨික දේවාශිර්වාදය ඔබවෙත ඇදී එන අයුරු ඔබටම දැනෙනු ඇත. මෙත් බෝසතුන් වන්දනාව අනුරාධපුර පොළොන්නරු යුගය හා වත්මන් යුගය සසඳන කල්හි සංකල්පීමය විතැන්වීමකට ලක්ව ඇත. ඒ අනුව උන්වහන්සේගේ ඍජු හා වක්‍ර සන්නිවේදනය චිත්ත ශක්තිය සහිත උදවිය වෙත යොමුව පවතී. එය මනා ලෙස කළමනාකරණය කළහොත් මනෝභ්‍රාන්ති වශයෙන් නොව මනෝමය ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දෙවියන් දැක ගැනීමට ඔබට හැකිය. එමතු නොව යම් අයකුට අවශ්‍ය නම් ඊනියා විද්‍යාවේ එන ක්වන්ටම් භෞතිකය වැනි සුසමාදර්ශයක් ඇසුරින්ද එකී ශක්ති විද්‍යාත්මක න්‍යාය යම් පමණකට අවබෝධ කරගත හැකිය. එයට නිදසුනක් නම් මහාචාර්ය නලින් ද සිල්වා ඉලෙක්ට්‍රෝන චුතවී ප්‍රතිසන්ධිවන බවට ගොඩනැංවූ ප්‍රවාදයයි.

# මිනිසා හඳුනාගැනීම : සිතිවිල්ලක්

- ඩෙන්සිල් සේනාධීර -

ඇතැම් පුද්ගලයින් හුවා දැක්වීමත් ඇතැම් පුද්ගලයින් හෙළා දැකීමත් දෛනික ජීවිතයේදී බොහෝවිට අප අතින් සිදුවේ. අපට ඉතා සමීපව වාසය කරන පුද්ගලයින් සම්බන්ධයෙන් මෙන් ම ජන සමාජයෙහි කැපී පෙනෙන චරිත සම්බන්ධයෙන් ද එලෙස ප්‍රතික්‍රියා දැක්වීමට බොහෝ විට අපි යොමු වෙමු.

අප එලෙස යොමු වනුයේ එකී පුද්ගලයින් හා අප අතර පැවති කිසියම් අන්තර්සම්බන්ධතාවකදී අප මුහුණ දුන් අත්දැකීමක් හෝ අත්දැකීම් සමුදායක් පදනම් කර ගෙන විය හැකිය. නොඑසේනම් එම පුද්ගලයින් සම්බන්ධයෙන් අපට දැනගන්නට ලැබී ඇති යම් යම් තොරතුරු පදනම් කරගෙන විය හැකිය. මෙලෙස එක් එක් පුද්ගලයින් සම්බන්ධයෙන් අප කරන විනිශ්චය නොඑසේනම් ඔවුන් පිළිබඳව අප තුළ ගොඩනැගී ඇති ආකල්පය කෙතෙක් දුරට නිවැරදි හා සාධාරණ විය හැකිද? සමාජ සබඳතා නිසා අප අතර බිහිවන බොහෝ ගැටුම් අවම කරගැනීම පිණිස මෙම ප්‍රශ්නය සංක්ෂිප්තව හෝ විමසා බැලීම ප්‍රයෝජනවත් වන්නේයැයි සිතේ.

කවර පුද්ගලයෙකු සමග වුව ද අප විසින් පවත්වනු ලබන සබඳතා මගින් ලැබෙන අත්දැකීම් හෝ අපට ලැබෙන තොරතුරුවල හෝ සීමාවක් මෙන්ම විවිධත්වයක් ද ඇත. එම අත්දැකීම් වින්දනය කරනුයේ හෝ එම තොරතුරු අගැයීම කරනුයේ ද අප එකිනෙකාගේ දෘෂ්ටි කෝණයෙනි. එක ම පුද්ගලයා පිළිබඳව කෙනෙකු විසින් කරනු ලබන විනිශ්චය තවත් කෙනෙකු විසින් ඔහු පිළිබඳව කරනු ලබන විනිශ්චයට වඩා වෙනස් වනුයේ හෝ වෙනස් විය හැක්කේ එබැවිනි.

ඇතැම් පුද්ගලයින් සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුට පොදුවේ එකඟ විය හැකි විනිශ්චයන් ද නැතැයි කිව නොහැකිය. බොහෝ දෙනාගේ ගෞරවාදරයට මෙන් ම අගෞරවයට ද භාජනය වන පුද්ගලයෝ පොදු සමාජය තුළ නැතුවා ම නොවේ. කෙසේවෙතත් අප මිනිසුන් පිළිබඳව දක්වන ආකල්පය වූකලී ඇත්තවශයෙන්ම ඒ පුද්ගලයාගේ සැබෑ ස්වභාවයද නොඑසේනම් ඒ පුද්ගලයා පිළිබඳව සීමිත අත්දැකීම පදනම් කරගෙන අපගේ මනස විසින් ගොඩනගාගෙන ඇති ප්‍රතිරූපයක්ද?

මෙහිදී සැලකියයුතු තවත් වැදගත් කරුණක් නම් පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ සමාජ සංසිද්ධියක් රික්තයක් තුළ සිදු නොවන බවයි. යහපත්යැයි අප සිතන ක්‍රියාවක් හෝ වේවා අයහපත්යැයි අප කල්පනා කරන ක්‍රියාවක් හෝ වේවා කිසිවෙකුට හුදෙකලාව සිදු කළ නොහැකිය. ඒ සඳහා පසුබිම් වන සාධක රාශියක් පවතී. පුද්ගලයාගේ කායික හා මානසික සාධක මෙන් ම ඔහු හා සම්බන්ධ සමාජයීය, ආර්ථික, දේශපාලනමය හා සංස්කෘතික යනාදී සංකීර්ණ සාධක රාශියක් ඒ සඳහා හේතු ප්‍රත්‍ය වෙයි.

අපගේ සතුටට මෙන් ම අසතුටට ද බොහෝවිට තුඩු දෙන්නේ අප අවට ජීවත්වන්නවුන් සමග අප විසින් පවත්වනු ලබන සම්බන්ධතාවන්ගේ ස්වභාවය යි. සමාජමය ජීවිතයක් ගතකරන මිනිසා විසින් පුද්ගලාන්තර සබඳතා ගොඩනගා ගැනීමේ ක්‍රියාවලියේදී සිදුවන එක් සුවිශේෂ සිද්ධියක් නම් අප ඉහත සඳහන් කළ පරිදි ඒ ඒ පුද්ගලයින් පිළිබඳව විවිධ ආකල්ප අප සිත්හි ජනිතවීම සහ අප ඔවුන් සමග පවත්නා සම්බන්ධතා එකී ආකල්ප පදනම් කොටගෙන ක්‍රියාත්මක වීමයි.

අංගුත්තර නිකාය නමැති පැරණි බෞද්ධ ග්‍රන්ථයෙහි දක්නට ලැබෙන කිසියම් මාර්ගෝපදේශයක් මෙහි ලා සඳහන්කිරීම වැදගත් වන්නේයැයි හැඟේ. එම ග්‍රන්ථයෙහි එන ඨාන සූත්‍රය විසින් මනුෂ්‍යයෙකු තුළ පැවැතිය යුතු මූලික යහගුණ සතරක් පෙන්වාදෙමින් ඒවා කෙතරම් දුරට යමෙකු තුළ පවතින්නේද යන්න සොයාගැනීම සඳහා වන ක්‍රම වේදයක් අපට හඳුන්වා දෙනු ලැබේ. එම ගුණාංග සතර වනුයේ විනීතබව, අවංකභාවය, ධෛර්යය සහ ප්‍රඥාව ය.

ඨාන සූත්‍රයෙහි දක්වෙන පරිදි කෙනෙකු කෙතරම් දුරට විනීත පුද්ගලයෙක්ද යන්න හඳුනා ගත හැකිවනුයේ ඔහු ඇසුරු කිරීමෙනි. සූත්‍රය පෙන්වා දෙන අන්දමට කෙටි කලක් ඇසුරු කිරීමෙන් එය කළ හැකි නොවේ. ඒ සඳහා දීර්ඝ කාලයක් ගතකිරීම අවශ්‍යය. තව ද එහි ලා හුදු දිගුකලක් ඇසුරු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ඒ සඳහා තියුණු නිරීක්ෂණයක නිරතවීම ද අවශ්‍යය. තවදුරටත් සූත්‍රය පෙන්වා දෙන පරිදි එලෙස කිසියම් නිවැරදි විනිශ්චයකට එළඹිය හැකිනුයේ එම කාර්යයෙහි නිරතවන නුවණැත්තෙකුට පමණි.

**සංවාසෙන භික්ඛවෙ සීලං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉතරං. මනසිකරොතා නො අමනසිකාරා පඤ්ඤාවතා නො දුප්පඤ්ඤෙන.**

ඨාන සූත්‍රය සඳහන් කරන අන්දමට කෙනෙකුගේ අවංකභාවය හඳුනාගත හැකි වනුයේ ඔහු හා එක්ව වැඩ කිරීමෙනි. ඒ අන්දමින් දීර්ඝ කාලයක් තිස්සේ ඉතා සුපරීක්ෂාකාරීව කිසියම් කාර්යයක නිරතව සිටින නැණවතෙකුට අන් තැනැත්තා කෙතරම් අවංක පුද්ගලයෙක් ද යන්න විනිශ්චය කිරීමට කිසියම් අවකාශයක් ලැබේ.

**සංවොහාරෙන භික්ඛවෙ සොචෙය්‍යං වෙදිතබ්බං. ...**

යමෙකු කෙතරම්දුරට ධෛර්ය සම්පන්න පුද්ගලයෙක්ද යන්න හඳුනා ගතහැකි වනුයේ ඔහු ආපදාවලට එනම් ජීවිතයේ විවිධ අභියෝගවලට මුහුණදෙන අන්දම දිර්ඝ කාලයක් තිස්සේ මනා නුවණින් යුතුව තියුණු නිරීක්ෂණයට ලක්කිරීමෙනි.

**ආපදාසු භික්ඛවෙ ථාමො වෙදිතබ්බං. ...**

එම සූත්‍රය අවසාන වශයෙන් පෙන්වාදෙන පරිදි යමෙකුගේ ප්‍රඥාවන්තබව පිළිබඳ යම් අවබෝධයක් ලබාගත හැකිවනුයේ ඔහු හා සාකච්ඡාවක හෝ සංවාදයක නිරතවීමෙනි. කෙසේවෙතත් එවැනි කරුණක් සම්බන්ධයෙන් වුවද නිගමනයකට එළඹිය හැකිවනුයේ කෙටිකලක් තුළදී නොව දීර්ඝ කාලයක් තිස්සේ එම කාර්යයෙහි විමැසිලිමත්ව යෙදී සිටින නැණවතෙකුට පමණි.

**සාකච්ඡාය භික්ඛවෙ පඤ්ඤා වෙදිතබ්බං. ...**

කවර පුද්ගලයෙකුගේ ස්වභාවය පිළිබඳව වුව ද තීරණයකට එළඹීම කෙතරම් දුෂ්කර ද යන්නත් එය කෙතරම් විමැසිල්ලෙන් කළයුතු කාර්යයක්ද යන්නත් ඉහත සඳහන් කරුණුවලින් අපට පෙනීයයි. හුදෙක් කෙනෙකුගේ බාහිර පෙනුම, කථාවිලාසය, සමාජ තත්වය, පමණක් නොව ඔහු කෙතරම් උගතෙක්ද යන්න පවා මෙහිලා වැදගත් සාධක නොවේ. පුද්ගලයෙකුගේ එක් වචනයක් හෝ එක් ක්‍රියාවක් පදනම් කරගෙන බොහෝවිට අප විසින් ගනුලබන ක්ෂණික තීරණ කෙතරම් සාවද්‍ය හා අවදානම් සහිත වියහැකිද යන්නත් එමෙන් ම වර්තමානයේ විවිධ මාධ්‍ය තුළින් අප හමුවට පැමිණෙන පුද්ලයින් සම්බන්ධයෙන් අප ගේ සිත්වල නිර්මාණයවන මනහර චිත්‍ර කෙතරම්දුරට අප නොමග යවනසුළු විය හැකිද යන්නත් අප අපගෙන් ම ප්‍රශ්න කිරීම වැදගත් වන බව ද මෙයින් පෙනේ. එමෙන් ම අන් පුද්ගලයින් සම්බන්ධයෙන් පමණක් නොව අපගේ ස්වභාවය අවබෝධකර මාර්ගෝපදේශ අපටම ද බොහෝ සේ උපකාරීවනු නිසැක ය. කිසියම් පුද්ගලයෙක් ප්‍රශංසාවට හෝ ගර්හාවට ලක් කිරීම වෙනුවට ඔහු කියුම් හා කෙරුම් අගැයීමට ලක් කිරීමත් ඔහු එලෙස ක්‍රියා කිරීමට පසුබිම් වූ හේතු ප්‍රත්‍ය විමසා බැලීමත් වඩාත් වැඩදායකය. පුද්ගලයින් හුවා දැක්වීමට හා හෙළා දැකීමට අප තුළ පවත්නා සැඟවුණු මානසික ප්‍රවණතාව මැනැවින් තේරුම් ගෙන පුද්ගලයින් පිළිබඳව නොව අදාල එක් එක් ක්‍රියාව පිළිබඳව උපේක්ෂාවෙන් යුතුව විමසා බැලීමට යොමුවීම වඩාත් උචිත පිළිවෙත බව මේ අනුව පෙනේ. කෙසේවෙතත් නිරීක්ෂකයා මෙන් ම නිරීක්ෂණයට භාජනය වන්නාද නිරන්තරව වෙනස්වෙමින් පවත්නා ලෝකයක අප විසින් එළඹෙනු ලබන කවර නිගමනයක් වුව ද නිත්‍ය නොවන බව ද මෙහිලා සඳහන් කළ යුතු ය.